වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த செயல்திறன் அறிக்கை
Annual Performance Report
2018



විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය
விஞ்ஞான, தொழில்நுட்பவியல் மற்றும் ஆராய்ச்சி அமைச்சு
Ministry of Science, Technology and Research

වාර්ෂික කාර්යසාධන වාර්තාව

2018

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 රාජ්‍ය

මුදල් චක්‍රලේඛයේ සඳහන් උපදෙස් පරිදි

සම්පාදනය කරන ලදී.

පටුන

1. හැඳින්වීම **01**

1.1 අමාත්‍යාංශයේ අරමුණු සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක 04

2. සංවිධානාත්මක සැකැස්ම **05**

2.1 පාලන සහ මුදල් අංශය 05

2.2 තාක්ෂණ පැවරුම් අංශය 05

2.3 තාක්ෂණ සහ පර්යේෂණ සංවර්ධන අංශය 05

2.4 අභ්‍යන්තර විගණන අංශය 05

2.5 විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය (COSTI) 06

3. 2018 වර්ෂය තුළ අමාත්‍යාංශයේ කාර්යසාධනය **06**

3.1 පාලන සහ මුදල් අංශය 06

3.2 තාක්ෂණ පැවරුම් අංශය (විද්‍යාතා වැඩසටහන) 06

3.3 තාක්ෂණ සහ පර්යේෂණ සංවර්ධන අංශය 14

3.4 අභ්‍යන්තර විගණන අංශය 21

3.5 විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ලේකම් කාර්යාලයේ (COSTI) සංවර්ධන මූලාරම්භයන් 21

3.6 ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය 22

3.7 ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයතනය (SLINTEC) 23

3.8 2018 වර්ෂයේ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම 27

4. 2018 වර්ෂයේ මූල්‍යමය ජයග්‍රහණ **30**

4.1 අමාත්‍යාංශයේ සහ ආයතනයන්හි මූල්‍යමය ජයග්‍රහණයන්හි සාරාංශය 30

4.2 අමාත්‍යාංශයේ පුනරාවර්තන වියදම් 30

4.3 ආයතනයන්හි පුනරාවර්තන වියදම් 31

4.4 අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදම් 32

4.5 ආයතනයන්හි ප්‍රාග්ධන වියදම් 35

4.6 අත්තිකාරම් ගිණුම් 35

පෙර දැක්ම

2020 වර්ෂයේදී විද්‍යාව හා තාක්ෂණයෙන් උසස් රටක් බවට ශ්‍රී ලංකාව පත් කිරීම

මෙහෙවර

ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධනයට අත්‍යවශ්‍ය වූ නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය සහ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම හා ආර්ථික ක්‍රියාදාමයන් පුළුල් කිරීම සඳහා, විද්‍යාත්මක පර්යේෂණ සංවර්ධනය සහ තාක්ෂණ පැවරුම් ඇතුළත්ව විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමට සහ ප්‍රචලිත කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.

1. හැදින්වීම

විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදනය, ආර්ථික වර්ධනය සහ මානව සංවර්ධනය උදෙසා දීර්ඝ කාලයක් මුළුල්ලේ වැදගත් කාර්යභාරයක් ඉටුකරන්නාවූ අංශයක් ලෙස සැලකෙනුයේ ආර්ථික ප්‍රගමනයත්, සෞඛ්‍ය ක්ෂේත්‍රය, අධ්‍යාපනය සහ යටිතලයන්හි සංවර්ධනයන් සඳහා අඩිතාලමත්, සැපයෙනුයේ තාක්ෂණික හා විද්‍යාත්මක විප්ලවයන් හරහා වන බැවිනි. තිරසර සහ අංගසම්පූර්ණ සංවර්ධනයක් අත්කරගැනීමේදී එල්ල වන අභියෝගයන්ට සාර්ථකව මුහුණ දෙනු පිණිස විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ සිදුකරනු ලබන රාජ්‍ය හා පෞද්ගලික ආයෝජනයන් ඉහළ නංවා ගත යුතු වේ. එක්සත් ජාතීන්ගේ 2030 තිරසර සංවර්ධනය සඳහා වූ න්‍යාය පත්‍රයේ අරමුණු 9 හි ඉලක්ක වන "ප්‍රත්‍යස්ථිතික යටිතලයන් ගොඩනැගීම, අංගසම්පූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය සහ නවෝත්පාදනය පෝෂණය කිරීම" සාක්ෂාත් කරගනු පිණිස දළ දේශීය නිෂ්පාදිතයෙහි කොටසක් ලෙස පර්යේෂණ හා සංවර්ධන (R & D) වියදමද ඉහළ නැංවිය යුතු වේ.

ශ්‍රී ලංකාවට අදාලව ගත්කල, පර්යේෂණ හා සංවර්ධන අංශය සම්බන්ධව රජය විසින් සිදුකරන ආයෝජනයන් අඩු ප්‍රමුඛතා මට්ටමක පවතින බව පෙනීයයි. උදා :- UNESCO වාර්තාවකට අනුව, ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.1%ක් මේ අංශය සඳහා ආයෝජනය කෙරෙනමුත් කලාපීය රටවල සාමාන්‍යය 2.41% ක් වේ. එමෙන්ම වැඩි ආර්ථික ප්‍රතිලාභයක් අත්කරගැනීම සහ අධිතාක්ෂණික අපනයනයන් වෙත යොමුවීම උදෙසා නැගීඑන තාක්ෂණයන් භාවිතයට ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අවධානය නිසිපරිදි යොමු වී නොමැති බවටද, මතයක් පවතී. මෙම සාම්ප්‍රදායික ප්‍රවේශය පරිවර්තනයකට ලක් කරමින්, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් නැගී එන තාක්ෂණයන් සහ අධිතාක්ෂණික අපනයනයන් පිළිබඳ අවධානය යොමුකෙරෙන විවිධ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමට පියවර ගනු ලැබ ඇත. මේ සඳහා, සූර්ය පැනල මූලාකෘති නිෂ්පාදන ව්‍යාපෘතිය, ශ්‍රී ලංකා ජෛවතාක්ෂණ සහ ජෛවතාක්ෂණ නවෝත්පාදන උද්‍යානය, ජාතික විද්‍යා මධ්‍යස්ථානය, යාන්ත්‍ර ඉලෙක්ට්‍රොනික විද්‍යාවෙන් සවිබල ගැන්වෙන ආර්ථික සංවර්ධන මූලාරම්භය, පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් තාක්ෂණ බීජෞෂණාගාර පහසුකම් සපයාදීම, නව නිපැයුම් සහ නවෝත්පාදන ප්‍රවර්ධනය සඳහා වූ නවෝත්පාදන කඩිනම් කරවීමේ අරමුදල් යෙදවීමේ යාන්ත්‍රණය, නවීන පර්යේෂණ සහ සංවර්ධන සංකීර්ණය ස්ථාපනය කිරීම, නිනිති තාක්ෂණ විශිෂ්ටත්ව මධ්‍යස්ථානයෙහි විද්‍යාගාර පහසුකම් පුළුල් කිරීම, නිනිති චන්ද්‍රිකා දියත් කිරීම, පෘථිවි නිරීක්ෂණ දත්ත ලබාගැනීම සහ බෙදාහැරීම සඳහා ජාතික මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම යනාදිය ඇතුළත් වේ. අදාල රේඛීය අමාත්‍යාංශය හා සහයෝගීතාවයෙන් විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු විද්‍යාව හා ගණිත (STEM අධ්‍යාපනය) ප්‍රවර්ධනය, තාක්ෂණය පදනම් කරගත් විෂයමාලා සංවර්ධනය මඟින් විවිධ මූලාරම්භයන් හරහා සියලු මට්ටම් හිදී විද්‍යාව ප්‍රචලිත කිරීමේ කාර්යය ප්‍රවර්ධනය සිදුකෙරේ. මෙම කාර්යය සාක්ෂාත් කරගනු පිණිස, පර්යේෂණ, පර්යේෂණ සඳහා අරමුදල් සපයාදීම සහ සංවර්ධන ප්‍රමුඛතාවන් අතර සබඳතා ස්ථාපනය කිරීම සඳහා ඉහළම ප්‍රමුඛතාව ලබාදීම සඳහා අමාත්‍යාංශය විසින් අඛණ්ඩව පියවර ගනු ලැබිණි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමන් විසින් සිදුකරනු ලැබූ විෂයයන් හා කාර්යයන් පැවරීම හා අනුකූලව 2018 දෙසැම්බර් 28 දිනැති අංක 2103/34 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ පහත සඳහන් විෂයයන්, කාර්යයන් සහ ආයතනයන්, විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යවරයා වෙත පැවරේ.

විෂයයන් හා කාර්යයන්

1. විද්‍යාව, තාක්ෂණ සහ පර්යේෂණ යන විෂයයන්ට අදාළව සහ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා යනාදිය යටතට ගැනෙන විෂයයන් හා අදාළව ප්‍රතිපත්තීන්, වැඩසටහන් සහ ව්‍යාපෘතීන් සම්පාදනය, ඒවා සුපරීක්ෂණය සහ ඇගැයීමට ලක්කිරීම.

2. ජාත්‍යන්තර වශයෙන් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයෙහි සිදුකරනු ලැබූ පර්යේෂණයන් ඇසුරෙන් ලත් නව සොයාගැනීම් සහ පර්යේෂණ සිදුකිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම.

3. දැනුම මත පදනම් වූ ආර්ථික සංවර්ධනයක් උදෙසා විද්‍යාව, තාක්ෂණ සහ නවෝත්පාදන වැඩිදියුණු කිරීම.

4. විද්‍යාත්මක, කාර්මික සහ සංවර්ධන ක්‍රියාකාරකම් පුළුල් කිරීම සඳහා පියවර ගැනීම.

5. පර්යේෂණ සැලසුම් කිරීම සහ සිදුකිරීම සඳහා පර්යේෂණ සහ පර්යේෂණ ආයතන වෙත පහසුකම් සලසාදීම.

6. නිනිති සහ ජෛව තාක්ෂණය ඇතුළත්ව, නව පර්යේෂණ සහ සොයාගැනීම් පිළිබඳ තොරතුරු, ව්‍යාපාරික ප්‍රජාව ඇතුළත්ව අදාල පාර්ශ්වයන් වෙත ලබාදීම.

7. ප්‍රමිතීන් ස්ථාපනය සහ පරිපාලනය හා අදාළ ක්‍රියාකාරකම්

8. වෙනත් අමාත්‍යාංශ යටතේ පවත්නා පර්යේෂණ ආයතනයන් විසින් පවත්වනු ලබන පර්යේෂණ වැඩසටහන් සඳහා කාර්මික සහාය ලබාදීම.

9. නව සොයාගැනීම් සිදුකිරීම උදෙසා ප්‍රජාවන් වෙත මාර්ගෝපදේශකත්වය ලබාදීම සහ අභිප්‍රේරණය සඳහා පියවර ගැනීම.

10. විද්‍යාව, තාක්ෂණ සහ නවෝත්පාදනයන් ප්‍රජාව වෙත හඳුන්වාදීම හා ඒ හා අදාලව ව්‍යවසායකයින් බිහිකිරීම.

11. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක සියලු පර්යේෂණ ආයතන අතර සම්බන්ධීකරණය හරහා ජාතික සංවර්ධන අභිමතාර්ථයන් ළඟාකරගැනීමට සක්‍රීයව දායක වීම.

12. ජාත්‍යන්තර විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ ආයතන සමඟ සම්බන්ධීකරණය සහ සහයෝගීතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

13. විවිධ රටවල් සමඟ ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික සහයෝගීතාවයන් ඇතිකර ගැනීම හරහා විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ වැඩසටහන් දියත් කිරීමෙන් ආර්ථික ප්‍රගතියක් අත්කර ගැනීම.

14. ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රවර්ධනය සහ සංවර්ධනය සඳහා පර්යේෂණ ක්‍රියාත්මක කිරීම.

15. බුද්ධිමය දේපළ පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ පරිපාලන කටයුතු හා අදාළ කාර්යයන් හා ලෝක බුද්ධිමය දේපළ කාර්යාලයට අදාල කාර්යයන්

16. අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන් වෙත පැවරී ඇති වෙනත් සියලුම විෂයයන් හා අදාළ කරුණු

17. අමාත්‍යාංශය වෙත පැවරී ඇති ආයතනයන්හි සුපරීක්ෂණ කටයුතු

ඒ අනුව, ඉහත කාර්යයන් සපුරාගැනීම අරමුණු කරගනිමින් පහත ආයතනයන් විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

ආයතන

1. නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනය (ACCIMT)
2. කාර්මික තාක්ෂණ ආයතනය (ITI)
3. ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERDC)
4. ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS)
5. ජාතික පර්යේෂණ සභාව (NRC)
6. ජාතික විද්‍යා පදනම (NSF)
7. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම (NASTEC)
8. අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB)
9. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම (SLIC)
10. ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය (Planetarium)
11. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)
12. ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ (පෞද්) සමාගම (SLINTEC)
13. ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය (NIPO)

අංක 01/2004 දරණ 2004.02.24 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛයෙහි 3.2 වගන්තිය යටතේ වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළිබඳව සඳහන් කර ඇති මාර්ගෝපදේශයන් හා අනුකූලව මෙම වාර්තාව සකස් කරනු ලැබ ඇති අතර 2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම්හි ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම්හි ප්‍රගතිය මෙම වාර්තාව සඳහා ඇතුළත් කර ඇත.

2018 වර්ෂය සඳහා අමාත්‍යාංශය වෙත ලබා දී ඇති මුළු පුනරාවර්තන සහ ප්‍රාග්ධන අයවැය වෙන්කිරීම් පිළිවෙලින් රුපියල් මිලියන 1,888.60 ක් හා රුපියල් මිලියන 4,808.528 කි. මුළු වෙන්කිරීම් වලින් රුපියල් මිලියන 1,711.701 ක් වූ පුනරාවර්තන වියදම් හා රුපියල් මිලියන 3,232.802 ක් වූ ප්‍රාග්ධන වියදම්, 2018 වර්ෂය තුළ දී වැය කරන ලදී.

1.1 අමාත්‍යාංශයේ අරමුණු සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක



2. සංවිධානාත්මක සැකැස්ම

අමාත්‍යාංශය පහතින් සඳහන් කර ඇති අංශ පහකින් සමන්විත වේ.

1. පාලන සහ මුදල් අංශය
2. තාක්ෂණ පැවරුම් අංශය (විද්‍යාතා වැඩසටහන)
3. තාක්ෂණ සහ පර්යේෂණ සංවර්ධන අංශය
4. අභ්‍යන්තර විගණන අංශය
5. විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය (COSTI)

2.1 පාලන හා මුදල් අංශය

බලතල පවරාදීම යටතේ, කාර්යාල පරිපාලනය, මානව සම්පත් කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය සහ අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනයන්හි ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ වගකීම මෙම අංශය වෙත පැවරී ඇත.

2.2 තාක්ෂණ පැවරුම් අංශය

විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන 267 ක් හරහා, මහජනතාව සහ පාසැල් සිසුන් අතර විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා බිම්මට්ටමින් කටයුතු කරමින් ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙත විද්‍යාත්මක දැනුම සහ තාක්ෂණය පවරාදීමේ වගකීම, මෙම අංශය වෙත පැවරි ඇත.

2.3 තාක්ෂණ සහ පර්යේෂණ සංවර්ධන අංශය

මෙම අංශය යටතේ ඒකක (Units) තුනක් පවතී.

2.3.1 ජාත්‍යන්තර සබඳතා ඒකකය

විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදන ක්ෂේත්‍රයේ ජාත්‍යන්තර සහයෝගීතාවයන් සඳහා පහසුකම් සලසාදීම මෙම ඒකකයේ වගකීම වේ.

2.3.2 විද්‍යා සහ පර්යේෂණ සංවර්ධන ඒකකය

මෙම ඒකකය වෙත පැවරී ඇති වගකීම වනුයේ, අරමුදල් සැපයීම, දැනුම නිර්මාණය, ධාරිතා ගොඩනැංවීම සහ තොරතුරු බෙදා හැරීම සඳහා තාක්ෂණ සංවර්ධන සහ නවෝත්පාදනයන් ආරම්භ කිරීම, ඒ සඳහා පහසුකම් සැපයීම සහ සහායය ලබාදීමයි.

2.3.3 සැලසුම් ඒකකය

අමාත්‍යාංශය සහ ඒ යටතේ ක්‍රියාත්මක ආයතනයන්හි, සංවර්ධන ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, සුපරීක්ෂණය, සමාලෝචනය සහ වාර්තා කිරීම සඳහා පහසුකම් සපයාදීමේ වගකීම මෙම ඒකකය වෙත පැවරී ඇත.

2.4 අභ්‍යන්තර විගණන අංශය

අමාත්‍යාංශයේ ක්‍රියාකාරීත්වය මනාව පවත්වාගෙන යාම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා දායක වීම මෙම අංශය වෙත පැවරී ඇති වගකීම වේ.

2.5 විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය

ශ්‍රී ලංකා ජාතික විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන (STI) ක්‍රමෝපාය හා අනුකූලව, අගයන් එක් කිරීම් සහ වාණිජකරණය ප්‍රවර්ධනය කිරීම උදෙසා කටයුතු කිරීම මෙම අංශයෙහි වගකීම වේ.

3. 2018 වර්ෂය තුළ අමාත්‍යාංශයේ කාර්යසාධනය

3.1 පාලන සහ මුදල් අංශය

3.1.1 2018.12.31 දිනට සේවක සංඛ්‍යා තොරතුරු

මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	සේවක සංඛ්‍යා හිඟය/ අතිරික්තය
ජ්‍යෙෂ්ඨ මට්ටම	25	21	පුරප්පාඩු 04
තෘතීය මට්ටම	29	03	පුරප්පාඩු 26
ද්විතීයික මට්ටම	741	648	පුරප්පාඩු 93
ප්‍රාථමික මට්ටම	236	233+76*	පුරප්පාඩු 03
එකතුව	**1031**	**981**	**පුරප්පාඩු 126**

* රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 හා අනුකූලව බඳවාගනු ලැබූ 80 දෙනෙකු සඳහා ස්ථිර පත්වීම් ලබාදී ඇති අතර මෙම පත්වීම් අමාත්‍යාංශයේ අනුමත සේවක සංඛ්‍යාවට ඇතුළත් කර නොමැත. මෙවැනි තනතුරු දරන්නන් හට පෞද්ගලික වන සේ මෙම තනතුරු ක්‍රියාත්මක වේ.

3.1.2 පුහුණු

3.1.2.1 විදේශ පුහුණුව 2018

වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වූ නිළධාරීන් සංඛ්‍යාව	අමාත්‍යාංශය විසින් දරණු ලැබූ මුළු පිරිවැය (රු.)
17	23	10,944,071.00

3.1.2.2 දේශීය පුහුණුව - පුහුණු, වැඩමුළු සහ සම්මන්ත්‍රණ

පුහුණු වැඩසටහන්		අමාත්‍යාංශය විසින් දරනු ලැබූ මුළු පිරිවැය (රු.)
තනි පුද්ගල පුහුණු 77	සියලුම කාර්යමණ්ඩල සමාජිකයින් සඳහා පුහුණු 03	610,917.00

3.2 තාක්ෂණ පැවරුම් අංශය (විදාතා වැඩසටහන)

අමාත්‍යාංශය යටතේ පවතින පර්යේෂණ ආයතනයන්හි තාක්ෂණය සහ විද්‍යාත්මක දැනුම රටෙහි බිම්මට්ටම දක්වා පවරා දීමේ අරමුණින්, 2000 වර්ෂයේදී, ජාතික වැඩසටහනක් ලෙස විදාතා වැඩසටහන ආරම්භ කරන ලදී. එමඟින් ව්‍යවසායකත්ව සංවර්ධනය හරහා ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය තුරන්කරනු පිණිස ජාතික ආර්ථිකයට දායකත්වය ලබා දේ. මෙම අරමුණ සාක්ෂාත් කරගනු පිණිස ශ්‍රී ලංකාවේ සියලු පරිපාලන දිස්ත්‍රික්ක ආවරණය කරමින් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් විදාතා සම්පත් මධ්‍යස්ථාන (VRCs) 267 ක් ස්ථාපනය කරනු ලැබ ඇත.

මෙම විදාතා සම්පත් මධ්‍යස්ථාන විද්‍යා හා තාක්ෂණ නිලධාරී (විද්‍යා උපාධිධාරියෙකු) විසින් කළමනාකරණය කෙරෙන අතර ඒ සඳහා එම නිලධාරියාට සහාය ලබාදෙනු පිණිස ක්ෂේත්‍ර සම්බන්ධීකාරක, පරිගණක ක්‍රියාකරු

සහ කාර්යාල සහායක යන නිලධාරිවරුන්ගෙන් සමන්විත සහායක කාර්යමණ්ඩලයක් පවතී. මෙම විදාතා සම්පත් මධ්‍යස්ථාන බහුතරයක් බේකරි උදුන, යෝගට් ඉන්කියුබේටරය, එළවළු වියලන යන්ත්‍රය සහ පොල්තෙල් නිස්සාරක යන්ත්‍රය යන මූලික තාක්ෂණ පහසුකම්වලින් සමන්විතය. සියලු විදාතා සම්පත් මධ්‍යස්ථාන සඳහා පරිගණක සහ අන්තර්ජාල පහසුකම් සපයා දී ඇත.

3.2.1 ක්‍රියාකාරකම්හි ප්‍රගතිය

විදාතා යටතේ 2018 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රධාන ක්‍රියාකාරකම්

1. තාක්ෂණ පැවරුම් වැඩසටහන
2. දැනුම්වත් කිරීමේ වැඩසටහන්
3. විද්‍යා හා තාක්ෂණ කුඩා පුස්තකාල සහ ප්‍රභාෂ්වර බ්ලොග් පිටුව
4. තාක්ෂණ සායන
5. විදාතා හරිත කඩමණ්ඩිය
6. විදාතා පද්ධති සහතිකකරණය / GMP / SLS යටතේ පරීක්ෂණ වාර්තා සහ තත්ත්ව සහතිකකරණය සඳහා මූල්‍යමය සහායය ලබාදීම
7. විද්‍යා හා තාක්ෂණ විශේෂ ව්‍යාපෘති
8. විදාතා කාර්යමණ්ඩලය සඳහා ධාරිතා වර්ධනය

3.2.1.1 තාක්ෂණ පැවරුම් වැඩසටහන්

නාගරික සහ ග්‍රාමීය ප්‍රජාවන් අතර පවත්නා තාක්ෂණ හිදැස පුරවාලීමේ අරමුණින් බිම්මට්ටමින් නව ව්‍යාපාරයන් ආරම්භ කිරීමට අපේක්ෂා කරන ව්‍යවසායකයින් සහ දැනට ව්‍යාපාර අරඹා ඇති ව්‍යවසායකයින්ගේ තාක්ෂණ අවශ්‍යතාවන් සපුරා ලනු පිණිස, දීපව්‍යාප්තව පිහිටුවා ඇති විදාතා සම්පත් මධ්‍යස්ථාන හරහා තාක්ෂණ පැවරුම් වැඩසටහන් සංවිධානය කෙරේ. 2018 වර්ෂයේදී ක්‍රියාත්මක කරනු ලැබූ තාක්ෂණ පැවරුම් වැඩසටහන්හි සාරාංශයක් පහත වගුවෙහි දක්වා ඇත.

අනුක්‍රමික අංක	ක්ෂේත්‍ර	වැඩසටහන් සංඛ්‍යාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
1.	ඉලෙක්ට්‍රොනික පරිගණක	515	140,606
2.	ආහාර තාක්ෂණය	1008	
3.	කෘෂිකර්මය	461	
4.	පාරිසරික	157	
5.	නැගීඑන තාක්ෂණයන්	1079	
6.	වෙනත්	476	
මුළු ගණන		3696	

කුරුණෑගල විදාතා සම්පත් මධ්‍යස්ථානයේ දී පැවැති සූර්ය පැනල පිළිබඳ තාක්ෂණ පැවරුම් වැඩසටහන

හොරණ විදාතා සම්පත් මධ්‍යස්ථානයේ දී පැවැති කිරි ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ තාක්ෂණ පැවරුම් වැඩසටහන

3.2.1.2 දැනුම්වත් කිරීමේ වැඩසටහන්

දිවයින පුරා ස්ථාපනය කරනු ලැබ ඇති විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන හරහා පාසැල් සිසුන් හා මහජනතාව සඳහා විද්‍යාව හා තාක්ෂණය හා අදාල මාතෘකා යටතේ දැනුම්වත් කිරීමේ වැඩසටහන් සංවිධානය කෙරෙන අතර ඒ හරහා මූලික විද්‍යා අධ්‍යාපනය ලබාගනු පිණිස සමාන සහ ප්‍රමාණවත් පරිදි අවස්ථාවන් සපයා දේ. 2018 වර්ෂයේදී ක්‍රියාත්මක කරනු ලැබූ දැනුම්වත් කිරීමේ වැඩසටහන්හි සාරාංශයක් පහත වගුවෙහි දක්වා ඇත.

අනුක්‍රමික අංක	ක්ෂේත්‍ර	වැඩසටහන් සංඛ්‍යාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
1.	ඉලෙක්ට්‍රොනික / පරිගණක	261	115,708
2.	ආහාර තාක්ෂණය	432	
3.	කෘෂිකර්මය	296	
4.	පාරිසරික	698	
5.	නැගීඑන තාක්ෂණයන්	660	
6.	වෙනත්	590	
මුළු ගණන		2937	

යක්කලමුල්ල විද්‍යාතා සම්පත් මධ්‍යස්ථානයේ දී පැවැති ජීව වායු උත්පාදනය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන

යක්කලමුල්ල විද්‍යාතා සම්පත් මධ්‍යස්ථානය විසින් සම්බන්ධීකරණය කරනු ලැබූ රුමස්සල, සොබාකෙත පරිසර සහ ජෛව විවිධත්වය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන

3.2.1.3 විද්‍යා හා තාක්ෂණ කුඩා පුස්තකාල සහ ප්‍රභාෂ්වර බ්ලොග් පිටුව

දිස්ත්‍රික්ක 24 ක විද්‍යා හා තාක්ෂණ කුඩා පුස්තකාල පිහිටවනු ලැබූ අතර ඒ අතුරින් පුස්තකාල 15 ක් ඊ - පුස්තකාල ලෙස පුළුල් කරනු ලැබිණි. පාසල් සිසුන් සහ තරුණ පරපුර සඳහා විද්‍යාව, තාක්ෂණය සහ නවෝත්පාදනය පිළිබඳ නවතම දැනුම සපයාදෙනු පිණිස ජාතික විද්‍යාතා ජාලය හරහා ප්‍රභාෂ්වර බ්ලොග් පිටුව හඳුන්වාදෙනු ලැබිණි. ඒ හරහා සිංහල, දමිළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම තොරතුරු දැනගැනීමේ පහසුකම් සලසාදෙනු ලබන අතර විද්‍යාත්මක සාක්ෂරතාවය ඉහළ නැංවීමත් නවෝත්පාදක සංස්කෘතියක් හරහා තරුණ පරපුර පෝෂණය කිරීමත් සිදුකෙරේ. 2018 වර්ෂය තුළදී ලිපි 98 ක් පළ කෙරිණි.

3.2.1.4 තාක්ෂණ සායන

ව්‍යවසායකයින් හමුවේ ඇති තාක්ෂණික ගැටලු සඳහා විසඳුම් ලබාදීමටත්, ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERD), කර්මික තාක්ෂණ ආයතනය (ITI), ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI), අපනයන සංවර්ධන මණ්ඩලය (EDB), ජාතික මෝස්තර මධ්‍යස්ථානය සහ කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) යන වෙනත් ආයතන සමඟ ව්‍යාපාරික සහයෝගීතාවයන් වැඩිදියුණු කරගනු පිණිස අවශ්‍ය වැඩිදුර සහාය ලබාදෙනු පිණිසත් විදාතා තාක්ෂණික සායන ආරම්භ කරනු ලැබ ඇත. ගාල්ල, මාතර, පුත්තලම, කුරුණෑගල සහ අම්පාර යන දිස්ත්‍රික්කයන්හි තාක්ෂණ සායන පවත්වනු ලැබූ අතර IDB, ITI සහ NERD ආයතන මඟින් ව්‍යවසායකයින් සඳහා පුහුණු වැඩසටහන් තුනක් පවත්වනු ලැබිණි.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පැවති තාක්ෂණ සායනය

3.2.1.5 විදාතා හරිත කඩමණ්ඩිය

නිෂ්පාදනයන්හි තත්ත්වය වැඩිදියුණු කරගනිමින් දේශීය තරඟකාරී වෙළඳපොළ වෙත ප්‍රවිෂ්ඨ වීමේ අවස්ථාව කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය වෙත ලබාදීමේ අරමුණින් මෙම සංකල්පය දියත් කරනු ලැබිණි. විදාතා හරිත කඩමණ්ඩිය දිස්ත්‍රික් 20 ක ක්‍රියාත්මක කරනු ලැබිණි.

හරිත කඩමණ්ඩිය

3.2.1.6 විදාතා පද්ධති සහතිකකරණය / GMP / SLS යටතේ පරීක්ෂණ වාර්තා සහ තත්ත්ව සහතික සඳහා මූල්‍යමය සහාය ලබාදීම

ග්‍රාමීය ප්‍රදේශ වල සිට වෙළඳපල වෙත පැමිණෙන නිෂ්පාදනයන්හි ගුණාත්මක භාවය සහතික කරනු පිණිස කාර්මික තාක්ෂණ ආයතනය සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා සහයෝගීතාවයෙන් පරීක්ෂණ වාර්තා සහ තත්ත්ව සහතික නිකුත් කරන ලදී.

SRI LANKA STANDARDS INSTITUTION
VIDATHA SYSTEM CERTIFIED
විදාතා

කාර්මික තාක්ෂණ ආයතන ශ්‍රවනාගාරයේදී විදාතා ව්‍යවසායකයින් වෙත පරීක්ෂණ වාර්තා ලබාදීම

3.2.1.7 විද්‍යා හා තාක්ෂණ විශේෂ ව්‍යාපෘති

තාක්ෂණය භාවිතයට ගැනීම වැඩිදියුණු කිරීම සහ මහජනතාව මුහුණපාන ප්‍රධාන ගැටළු කාර්යක්ෂම අයුරින් විසඳාලීමත් අරමුණු කරගනිමින්, විවිධ ක්ෂේත්‍රයන්හි විද්‍යා හා තාක්ෂණ විශේෂ ව්‍යාපෘතීන් සඳහා අමාත්‍යාංශය විසින් අරමුදල් යොදවා ඇත.

අනුක්‍රමික අංකය	දිස්ත්‍රික්කය	විද්‍යාතා සම්පත් මධ්‍යස්ථානය	ව්‍යාපෘති නාමය	වියදම් (රුපියල්)	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
1	මොණරාගල	මැදගම	කිරි ආශ්‍රිත නිෂ්පාදන	500,000.00	20
2	රත්නපුර	කුරුවිට	ජෛවභායක ඇසුරුම්	500,000.00	10
3	පොලොන්නරුව	හිඟුරක්ගොඩ	CCTV කැමරා නිෂ්පාදනය	372,150.00	15
4	පොලොන්නරුව	ලංකාපුර	ඖෂධීය තේ බෑග් නිෂ්පාදනය	92,500.00	20
5	පොලොන්නරුව	තමන්කඩුව	ඉරටු සහ පොල්කෙඳි ආශ්‍රිත නිෂ්පාදන	46,750.00	10
6	කළුතර	හොරණ	කිරි ආශ්‍රිත නිෂ්පාදන	460,000.00	10
7	මාතලේ	රත්තොට	අසමෝදගම් ස්ප්‍රීතු නිෂ්පාදනය	400,000.00	7
8	රත්නපුර	අයගම	පැළ තවාන් සහ කැපුම් මල් කර්මාන්තය සඳහා නවීන තාක්ෂණය හඳුන්වාදීම	469,359.00	11
9	බදුල්ල	මීගහකිවුල	බතික් නිෂ්පාදන	301,710.00	12
10	රත්නපුර	කලවාන	පැළ තවාන් සහ කැපුම් මල් කර්මාන්තය සඳහා නවීන තාක්ෂණය හඳුන්වාදීම	469,359.00	11
11	කුරුණෑගල	වාරියපොළ	කැපුම් මල් කර්මාන්තය පිළිබඳ ව්‍යාපෘතිය	480,000.00	8
12	හම්බන්තොට	අම්බලන්තොට	විසිරි ජල සම්පාදන ක්‍රමය භාවිතයෙන් දැල් ගෘහ තුළ බිම්මල් වගාව	683,100.00	27
13	ගම්පහ	ගම්පහ	පාවහන් නිෂ්පාදනය	380,000.00	5
14	හම්බන්තොට	අඟුණුකොළපැලැස්ස	පිරිසිදු පානීය ජලය සැපයීමේ ව්‍යාපෘතිය	320,000.00	100
15	ගාල්ල	යක්කලමුල්ල	තත්ත්වයෙන් උසස් කළු ගම්මිරිස් නිෂ්පාදනය	326,900.00	10

16	ගාල්ල	අක්මීමන	කැපුම් මල් ලෙස ඕකිඩ් ප්‍රචලිත කිරීම	303,600.00	10
17	මොණරාගල	බිබිල	වියලන ලද බිම්මල්	447,000.00	12
18	බදුල්ල	මීගහකිවුල	බෑග් නිෂ්පාදනය සඳහා අධි-තාක්ෂණ යන්ත්‍ර සූත්‍ර ලබාදීම	816,980.00	20
19	මන්නාරම	මුසලි	යෝගට් නිෂ්පාදනය	412,200.00	6
20	මහනුවර	හතරලියද්ද	පළතුරු සහ එළවළු වියළීම	346,000.00	10
21	පොලොන්නරුව	හිඟුරක්ගොඩ	විකල්ප බලශක්තිය පිළිබඳ ව්‍යාපෘතිය	86,254.00	15
22	මාතලේ	රත්තොට	අසමෝදගම් ස්ප්‍රීතු නිෂ්පාදනය (දෙවන අදියර)	55,000.00	7
23	ගම්පහ	බියගම	යෝගට් නිෂ්පාදනය	175,000.00	6
24	ගම්පහ	අත්තනගල්ල	කිරි ආශ්‍රිත නිෂ්පාදන	77,500.00	1
25	අනුරාධපුර	නොච්චියාගම	හඳුන්කූරු නිෂ්පාදනය	245,000.00	10
26	කෑගල්ල	කෑගල්ල	පළතුරු සහ එළවළු වියළීම	140,000.00	12
27	තළුතර	දොඩන්ගොඩ	මදුරු විකර්ශක හඳුන්කූරු	220,000.00	9
28	නුවර එළිය	අඹන්ගඟ කෝරළේ	පළතුරු සහ එළවළු	223,000.00	8
29	ගාල්ල	ඉමදුව	හඳුන්කූරු නිෂ්පාදනය	88,000.00	10
30	ගාල්ල	වැලිවිටිය දිවිතුර	තේ පැළ තවාන	177,000.00	10
31	කෑගල්ල	කෑගල්ල	තන්තු ආශ්‍රිත විසිතුරු නිෂ්පාදන	120,570.00	21
32	මාතර	මුලටියන	මී පැණි නිෂ්පාදනය පිළිබඳ ව්‍යාපෘතිය	207,000.00	50
33	මාතර	කඹුරුපිටිය	කැපුම් මල් කර්මාන්තය පිළිබඳ ව්‍යාපෘතිය	431,000.00	10
34	අනුරාධපුර	පලාගල	පිරිසිදු පානීය ජලය සැපයුම් ව්‍යාපෘතිය	500,000.00	65
35	මාතර	මාලිම්බඩ	විසිරි ජල සම්පාදන ක්‍රමය භාවිතා කෙරෙන බිම්මල් නිෂ්පාදන	273,700.00	7
36	කුරුණෑගල	අලව්ව	කිරි ආශ්‍රිත නිෂ්පාදන	160,000.00	2

37	මහනුවර	උඩුනුවර	පලතුරු සහ එළවළු වියළීම	115,000.00	11
38	ගම්පහ	මීරිගම	විද්‍යාත නිෂ්පාදන සඳහා අලෙවි පහසුකම් පුළුල් කිරීම	249,000.00	10
39	මඩකලපුව	මන්මුනෙයි බටහිර	අත්කම් නිර්මාණ	230,400.00	21
40	බදුල්ල	ඇල්ල	බිම්මල් නිෂ්පාදකයින් සවිමත් කිරීම	130,950.00	11
41	බදුල්ල	වැලිමඩ	කැපුම් මල් කර්මාන්තය පිළිබඳ ව්‍යාපෘතිය	498,560.00	16
42	බදුල්ල	ඌව පරණගම	කැපුම් මල් කර්මාන්තය පිළිබඳ ව්‍යාපෘතිය	498,560.00	16
43	බදුල්ල	හපුතලේ	කැපුම් මල් කර්මාන්තය පිළිබඳ ව්‍යාපෘතිය	464,600.00	23
44	අනුරාධපුර	මැදවච්චිය	පිරිසිදු පානීය ජලය සැපයීම පිළිබඳ ව්‍යාපෘතිය	640,464.28	21
45	ගාල්ල	තවලම	බෑග් නිෂ්පාදනය	500,000.00	10
46	රත්නපුර	ඇහැළියගොඩ	බිම්මල් වගාව සඳහා බඳුන් නිෂ්පාදනය	350,000.00	20
47	කළුතර	මදුරාවල	ස්පිරුලිනා පැළ වගාව	488,144.00	10
48	මාතර	අකුරැස්ස	ඕකිඩ් වගාව වැඩිදියුණු කිරීම	402,000.00	8
එකතුව				**15,874,310.28**	**765**

3.2.1.8 විද්‍යාත්‍ය කාර්යමණ්ඩලයේ ධාරිතා වර්ධනය

අනුක්‍රමික අංකය	පුහුණු වැඩසටහන	කාර්යමණ්ඩල කාණ්ඩය	ආයතනය	සහභාගී වූවන්ගේ සංඛ්‍යාව
1	කාර්මික තාක්ෂණ ආයතන තාක්ෂණයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්	කාර්මික තාක්ෂණ ආයතනය	71
2	ධනාත්මක චින්තනය	විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්	ඵලදායිතා ලේකම් කාර්යාලය	27
3	ඊ - පුස්තකාල පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්	කාර්මික තාක්ෂණ ආයතනය සහ ජාතික විද්‍යා පදනම	25
4	GMP විගණන පුහුණුව	විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය	179
5	ව්‍යාපෘති යෝජනා ලිවීම පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන	විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් සහ තාක්ෂණ හා මානව සම්පත් සංවර්ධන සහායක	කාර්මික සේවා කාර්යංශය	114
6	ඖෂධීය සබන් නිෂ්පාදනය පිළිබඳ පුහුණුව	විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්	කාර්මික තාක්ෂණ ආයතනය	15
7	ආකල්ප සංවර්ධනය සහ කාර්යාලයේ රාජකාරි	කාර්යාල සහායක	ජාතික කම්කරු අධ්‍යයන ආයතනය	27
8	සහතික පත්‍ර පාඨමාලා 3	විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්, කළමණාකාර සහකාර, කාර්යාල සහකාර	ජාතික කම්කරු අධ්‍යයන ආයතනය	3
9	ව්‍යවසායකත්ව සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ වැඩමුළුව	ක්ෂේත්‍ර සම්බන්ධීකාරක	කාර්මික සේවා කාර්යාංශය	195
10	විද්‍යාත්‍ය සම්පත් මධ්‍යස්ථානයන්හි NVQ 2 මට්ටමේ පරිගණක පාඨමාලා ක්‍රියාත්මක කිරීම පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩමුළුව	විද්‍යා හා තාක්ෂණ නිලධාරීන්, පරිගණක දත්ත ක්‍රියාකරු	ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ ආයතනය	256
11	සන්නිවේදන සහ තොරතුරු තාක්ෂණ වැඩමුළුව	පරිගණක දත්ත ක්‍රියාකරු	සී/ස නිපුණතා සංවර්ධන අරමුදල	59

3.3 තාක්ෂණ හා පර්යේෂණ සංවර්ධන අංශය

3.3.1 විද්‍යාත්මක සංවර්ධන වැඩසටහන

3.3.1.1 පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රයන් සඳහා සිදුකළ ආයෝජනයන් (ජාතික පර්යේෂණ සහ සංවර්ධන රාමුව - NRDF ක්‍රියාත්මක කිරීම)

- ජාතික පර්යේෂණ සහ සංවර්ධන රාමුවෙහි (NRDF) හඳුනාගනු ලැබූ මැදිහත්වීම් ක්‍රියාත්මක කරනු පිණිස පහසුකම් සලසාදෙමින් අමාත්‍යාංශය විසින් විශ්වවිද්‍යාල සහ ආයතන සමඟ පර්යේෂණ සම්මන්ත්‍රණ 17 ක් සංවිධානය කරනු ලැබිණි.

I. ආසියාවේ ආර්ථික සෞභාග්‍යය උදෙසා පෝෂණ අංශයේ ආයෝජනයන් සිදුකිරීම, ශ්‍රී ලංකා පෝෂණ සමාජයේ වාර්ෂික අධ්‍යයන සැසි සම්මන්ත්‍රණය ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ සහයෝගීතාවය යටතේ සංවිධානය කෙරනු ලැබිණි. මෙම සම්මන්ත්‍රණයෙහි ප්‍රධාන අරමුණ වූයේ ආර්ථික විද්‍යාඥයින්ට සහ පෝෂණ වෘත්තිකයින්ගේ සිය දැනුම හා අත්දැකීම් බෙදාහදාගැනීමට වේදිකාවක් සැපයීම හරහා කලාපයෙහි පෝෂණ සම්පත්හි කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට සහාය දීමයි. මෙම වැඩසටහන 2018 ජනවාරි 27 සහ 28 යන දිනයන්හිදී කොළඹ දී පවත්වනු ලැබිණි.

II. 2018 ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සමඟ සංවිධානය කෙරිණි. මෙම සම්මන්ත්‍රණය "නවෝත්පාදක හරිත ආර්ථිකයක් සඳහා නැගීඑන තාක්ෂණයන්" යන තේමාව යටතේ, 2018 පෙබරවාරි 1 සහ 2 යන දිනයන්හිදී බදුල්ලේදී පැවැත්විණි.

III. ඉංජිනේරු පීඨ තාක්ෂණික ශිෂ්‍ය අධ්‍යයන සම්මන්ත්‍රණය (FETSAC) – 2017 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය ඉංජිනේරු තාක්ෂණ පීඨය හා සහයෝගීතාවයෙන් සංවිධානය කෙරිණි. මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ වනුයේ ශිෂ්‍යයින්ගේ ඉංජිනේරු නවනිපැයුම් සහ නවෝත්පාදනයන් වැඩිදියුණු කිරීම සහ ඔවුන් කර්මාන්ත අංශයට නිරාවරණය වීමේ අවස්ථාව උදාකර දීම හරහා සමාජයට මෙහෙවරක් ඉටුකරලීමය. මෙම වැඩසටහන 2018 පෙබරවාරි 15 සහ 16 යන දිනයන්හිදී කොළඹ දී පැවැත්විණි.

IV. ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS) සමඟ 2017 වර්ෂය සඳහා ජාතික මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික සමාලෝචනය සමසංවිධානය කරන ලදී. මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ වූයේ අනෙකුත් වෘත්තිකයින්ට සහ මහජනතාවට ජාතික මූලික අධ්‍යයන ආයතනයේ විද්‍යාත්මක ක්‍රියාකාරකම් පිළිබඳ දැනුමක් ලබාදීමයි. මෙම වැඩසටහන 2018 මාර්තු 2 දින මහනුවරදී පැවැත්විණි.

V. "සුහුරු පරිගණක සහ පද්ධති ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය" කැළණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය සමඟ සමසංවිධානය කෙරිණි. මෙම සම්න්ත්‍රණයෙහි ප්‍රධාන අරමුණ වූයේ පර්යේෂණ විද්වතුන්, විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමණ්ඩල, පර්යේෂකයින් හා කර්මාන්ත විශේෂඥයින් හට, සුහුරු පරිගණක සහ පද්ධති ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ක්ෂේත්‍රයන්හි සිය පර්යේෂණයන් ඉදිරිපත් කිරීමේ වේදිකාවක් නිර්මාණය කර දීමයි. මෙම වැඩසටහන 2018 මාර්තු 29 දින කැළණියේදී පැවැත්විණි.

VI. "විඥානම්" ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය - 2018 (VIRC 2018) යාපනය විශ්වවිද්‍යාලය සමඟ සමසංවිධානය කෙරිණි. මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ වූයේ විවිධ විද්‍යා විෂය ක්ෂේත්‍රයන්හි දේශීය සහ ජාත්‍යන්තර පර්යේෂකයින් හට සිය පර්යේෂණ සොයාගැනීම්, අදහස් සහ අත්දැකීම් බෙදාගැනීම සඳහා විවෘත සම්මන්ත්‍රණයක් ලබාදීමයි. 2018 ජූලි 4 දින යාපනයේදී මෙම වැඩසටහන පැවැත්විණි.

VII. විද්‍යෝදය උපාධි අපේක්ෂක පර්යේෂණ දිනය 2018 (VURD 2018) "විශිෂ්ටත්වය කරා, ශිෂ්‍යයාගේ සිට පර්යේෂකයා කරා" යන තේමාව යටතේ, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය සමඟ සමසංවිධානය කරන ලදී. ජුනි 13 සහ 14 දින ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේදී මෙම වැඩසටහන පැවැත්විණි.

VIII. බහුවිෂයානුබද්ධ ප්‍රවේශයන් පිළිබඳ පස්වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICMA) 2018, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨය සමඟ සංවිධානය කෙරිණි. මෙම වැඩසටහන 2018 අගෝස්තු 31 දින කොළඹ දී පැවැත්විණි.

IX. ''වඩා හරිත අනාගතයක් උදෙසා'' යන තේමාව යටතේ, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ 10 වන වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය, රජරට විශ්වවිද්‍යාලය සමඟ සමසංවිධානය කෙරිණි. 2018 සැප්තැම්බර් 5 දින, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ දී මෙම වැඩසටහන පැවැත්විණි.

X. ''සහයෝගීතාවය හරහා වෘත්තීමය විශිෂ්ටත්වය ළඟාකරගැනීම'' යන තේමාව යටතේ ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සමඟ ''KDU ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය - 2018'' සමසංවිධානය කෙරිණි. මෙම වැඩසටහන 2018 සැප්තැම්බර් 13 සහ 14 දිනයන්හිදී කොළඹ දී පැවැත්විණි.

XI. ''වඩා සුරක්ෂිත අනාගතයක් කරා'' යන තේමාව යටතේ, ''යාපන විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය (JUIRC - 2018)'' යාපන විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පීඨය සමඟ සමසංවිධානය කෙරිණි. මෙම වැඩසටහන 2018 සැප්තැම්බර් 27 සහ 28 දිනයන්හිදී යාපන විශ්වවිද්‍යාලයේ දී පැවැත්විණි.

XII. ''සීමා අභිබවමින් විශිෂ්ටත්වය කරා'' යන තේමාව යටතේ සෞඛ්‍ය විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සමඟ සමසංවිධානය කෙරිණි. මෙම වැඩසටහන 2018 ඔක්තෝබර් 7 - 9 දක්වා කොළඹ දී පැවැත්විණි.

XIII. වියළි කලාපීය කෘෂිකර්මාන්තය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය - 2018, යාපනය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨය සමඟ සමසංවිධානය කෙරිණි. කෘෂිකර්මාන්තය සහ තාක්ෂණය පිළිබඳ විශේෂිතව වියළි කලාපීය කෘෂිකර්මාන්තය පිළිබඳ අවධානය යොමු වූ මෙම සම්මන්ත්‍රණයේදී සහභාගීවූවන්ට සිය සොයාගැනීම් බෙදාහැරීම සඳහා වේදිකාවක් සපයාදෙනු ලැබිණි. මෙම වැඩසටහන 2018 ඔක්තෝබර් 18 සහ 19 දිනයන්හිදී යාපනයේ දී පැවැත්විණි

XIV. ''2018 වන සම්පත් සහ පාරිසරික කළමනාකරණයෙහි සංවර්ධනය'' යන තේමාව යටතේ, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වන සම්පත් සහ පරිසර විද්‍යා අංශය සමඟ 23 වැනි ජාත්‍යන්තර වන සම්පත් සහ පරිසර සම්මන්ත්‍රණය - 2018 සමසංවිධානය කෙරිණි. මෙම වැඩසටහන ඔක්තෝබර් 19 – 20 දින කොළඹ දී පැවැත්විණි.

XV. පශ්චාත් උපාධි ආයතනයෙහි පර්යේෂණ කොංග්‍රසය - 2018 (PGIS RESCON - 2018), පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනය සමඟ සමසංවිධානය කෙරිණි. මෙම වැඩසටහන 2018 නොවැම්බර් 9 – 10 දිනයන්හිදී පැවැත්විණි.

XVI. කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය ආයතන සමඟ ආයුර්වේද, යුනානි, සිද්ධ සහ සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව පිළිබඳ හයවැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICAUST-2018) සමසංවිධානය කරන ලදී. මෙම වැඩසටහන 2018 ඔක්තෝම්බර් 26 – 28 දක්වා කොළඹදී පැවැත්විණි. මෙම සම්මන්ත්‍රණයෙහි අරමුණ වනුයේ විශිෂ්ට ගණයේ පර්යේෂකයින්, අධ්‍යනඥයින්, භෞතික විද්‍යාඥයින්, සම්ප්‍රදායික වෛද්‍ය වෘත්තිකයින්, ආයුර්වේද සහ ඖෂධීය නිෂ්පාදන නිපැයුම්කරුවන් සහ අපනයනකරුවන් සඳහා වේදිකාවක් සපයාදීම මෙම සම්මන්ත්‍රණයේ අරමුණ විය.

XVII. ඖෂධීය පැළෑටි, කුළුබඩු සහ වෙනත් ස්වභාවික නිෂ්පාදන පිළිබඳ ආසියානු සම්මන්ත්‍රණය ස්ලින්ටෙක් ඇකඩමිය සමඟ සහයෝගීතාවයන් සංවිධානාය කෙරිණි. මෙම වැඩසටහන 2018 දෙසැම්බර් 12 – 14 දක්වා පැවැත්විණි.

3.3.1.2 ජාතික විද්‍යා මධ්‍යස්ථානයෙහි ස්ථාපනය

- විද්‍යා තාක්ෂණ මධ්‍යස්ථාන සංගමයෙහි සාමාජිකත්වය ලබාගන්නා ලදී.
- හෝමාගම, පිටිපන ස්ථාපනය කරනු ලැබීමට නියමිත ජාතික විද්‍යා මධ්‍යස්ථානයෙහි ප්‍රධාන සැලසුම ගොඩනැංවීම පිණිස ජාතික විද්‍යා මධ්‍යස්ථාන පිළිබඳ චීන විශේෂඥ කණ්ඩායමක් ශ්‍රී ලංකාවට පැමිණිනි.

3.3.1.3 ශ්‍රී ලංකාව තුළ විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු විද්‍යා සහ ගණිත අධ්‍යාපන (STEM) සංවර්ධනය

I. විද්‍යා ගුරුවරුන් සඳහා " පාසැල්හි විද්‍යාව, තාක්ෂණය සහ පර්යේෂණ ඉගැන්වීම" පිළිබඳ පුහුණු වැඩමුළු මාලාවක් (09), ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය සමඟ සමසංවිධානය කෙරිණි. 2017 නොවැම්බර් සිට 2018 ජූනි දක්වා මෙම වැඩමුළු පැවැත්වුණු අතර දිවයින පුරා පාසැල්හි ගුරුවරුන් 450 ක් පුහුණු කරනු ලැබිණි.

II. " ආදර්ශ පාසැල් විද්‍යාගාර ස්ථාපනය සඳහා වන ජාතික වැඩසටහන" පිළිබඳ පුහුණුකරුවන් පුහුණුකිරීමේ පළාත් මට්ටමේ වැඩසටහන්, 2018 පෙබරවාරි සිට 2018 ජූනි දක්වා, ප්‍රධාන විද්‍යා ගුරුවරු, ගුරු උපදේශකවරුන් (විද්‍යා) සහ කලාප සහකාර අධ්‍යක්ෂකවරුන් (විද්‍යා) සඳහා පැවැත්විණි.

III. STEM අධ්‍යාපනය වැඩිදියුණු කිරීමේ අරමුණින්, අධ්‍යාපන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය (SLAAS) සමඟ සහයෝගීතාවයෙන් පළාත් මට්ටමින්, ගුරුවරුන් 1000 ක් සඳහා ගුරු පුහුණු වැඩමුළු ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශය විසින් කටයුතු කෙරුණි.

IV. දිවයින පුරා පාසැල් හි සිසුන් අතර විද්‍යා අධ්‍යාපනය ප්‍රචලිත කරනු පිණිස, අධ්‍යාපන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ සහයෝගීතාවයෙන්, විවිධ අංශ ඇතුලත් කරනු ලැබූ විද්‍යාව ප්‍රචලිත කිරීමේ වැඩසටහනක් අමාත්‍යාංශය විසින් සංවිධානය කෙරේ.

V. 2018 වර්ෂයේ දී 23 වැනි ජාත්‍යන්තර තාරකා විද්‍යා ඔලිම්පියාඩ් තරඟය සඳහා සත්කාරකත්වය ශ්‍රී ලංකාව විසින් දක්වනු ලැබිණි. ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය, කොළඹ විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යා ආයතනය, නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය සහ ශ්‍රී ලංකා ඔලිම්පියාඩ් සංගමය යන ආයතන සමඟ එක්ව අමාත්‍යාංශය විසින් සමසංවිධානය කෙරුණි. 2018 ජූලි මස සිට 2018 සැප්තැම්බර් මස දක්වා වැඩමුළු මාලාවක් පවත්වනු ලැබිණි.

3.3.1.4 විද්‍යාව ප්‍රචලිත කිරීම

- **විද්‍යා සඟරාව**

  පාසැල් සිසුන් සහ සාමාන්‍ය ජනතාව අතර විද්‍යාත්මක දැනුම බෙදාහැරීම අරමුණු කරගනිමින් 2018 වසර තුළ භාෂා ත්‍රිත්වයෙන් සකස් කරනු ලැබූ "විද්‍යා" පුවත්පත් අතිරේකය (පිටු 16) මසකට වරක් 2018 ජනවාරි මස සිට 2018 ජූලි මස දක්වා ප්‍රකාශයට පත්කරනු ලැබ දිනමිණ, තිනකරන් සහ ඩේලි නිව්ස් පුවත්පත් සමඟ බෙදාහරින ලද "e" ප්‍රවෘත්ති පත්‍රයක් ලෙසද ප්‍රකාශයට පත් කරනු ලැබිණි.

  විද්‍යා අධ්‍යාපනය සඳහා පාසැල් සිසුන් අභිප්‍රේරණය කිරීම සඳහා විශේෂ අවධානය "විද්‍යා" සඟරාව හරහා සිදුකෙරුණි. ලෝ ප්‍රකට විද්‍යාඥයින්ගේ සොයාගැනීම් සහ ඔවුන්ගේ නව ප්‍රවේශයන් ඇතුළත් ලිපි සහ ඔවුන් සමඟ සිදුකරනු ලැබූ සම්මුඛ සාකච්ඡා යනාදිය පළකිරීම හරහා මෙම අරමුණ සපුරා ගැනීමට අපේක්ෂා කෙරේ. ප්‍රශ්නාවලියක්ද ප්‍රකාශයට පත් කරනු ලැබූ අතර ජයග්‍රාහකයින් සඳහා වටිනා ත්‍යාගද ප්‍රදානය කරන ලදී.

- **වැඩමුළු**

තරුණ පරීක්ෂකයින් සඳහා වූ විද්‍යා සන්නිවේදනය සහ ලේඛන වැඩමුළුව (WINC - 2018), වයඹ විශ්ව විද්‍යාලය හා සමසංවිධානය කෙරිණි. ගණිතය සහ සංඛ්‍යානය, ව්‍යවහාරික විද්‍යාව, ආර්ථික විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව සහ තාක්ෂණය තේමාවන් යටතේ මෙය පැවැත් වූ අතර (WINC - 2018) සීමාවන් අභිබවා යන තිරසාර සංවර්ධනය යන තේමාව යටතේ තෙවැනි වරටත් පැවැත්වූ වයඹ ජාත්‍යාන්තර සම්මන්ත්‍රණයද සමසංවිධානය කරන ලදී.

- **ප්‍රදර්ශන**

ග්‍රාමීය ව්‍යවසායකයින් දිරිගැන්වීම සහ ව්‍යාපාරික දැනුම, මූලාධාර, උපදේශනය යනදිය හරහා බිම් මට්ටමේ ව්‍යාපාර ව්‍යාපෘති සංවර්ධනය අරමුණු කර ගනිමින්, v2025 – Enterprise Sri Lanka ප්‍රදර්ශනය සංවිධානය සඳහා දායකත්වය දැක්වීම.

වෘත්තීය මාර්ගෝපදේශකත්වය, ශිෂ්‍යයින් උද්යෝගිමත් ක්ෂේත්‍ර හඳුනාගැනීම, උසස් අධ්‍යාපන ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සහ නව නිපැයුම්කරුවන්ට ව්‍යාපාරික අවස්ථා උදාකර වීම අරමුණු කරගනිමින් ප්‍රදර්ශන 19කට වැඩි සංඛ්‍යාවක් සංවිධානය සඳහා දායකත්වය දැක්වීම.

- **විද්‍යා චිත්‍රපට උළෙල**

ගෝතේ ආයතන (Goethe Institute) සමඟ විද්‍යා චිත්‍රපට උළෙල - 2018 ආරම්භ කරනු ලැබ පාසල් සිසුන්, විශ්වවිද්‍යාල සිසුන් සහ මහජනතාව සඳහා විද්‍යා චිත්‍රපට බෙදාහැරීම සඳහා විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් 30 දෙනෙකු පුහුණු කරවනු ලැබිණි. විද්‍යාත්මක විනෝදාස්වාදය හා අත්දැකීම් ජාත්‍යාන්තර විද්‍යාත්මක ලෝකය සමඟ බෙදා හදාගැනීමට ශ්‍රී ලාංකිකයන් හට අවස්ථාව උදාකරදිම අරමුණින් මෙම වැඩසටහන් සංවිධානය කෙරිණි.

3.3.1.5 පර්යේෂණ සඳහා පහසුකම් සැපයීම

- පත්‍ර කලාවේදී විද්‍යා සන්නිවේදකයන් සහ වෙනත් උනන්දුවක් දක්වන පුද්ගලයින්ට සිය විද්‍යා දැනුම වර්ධනය කරගනු පිණිස විද්‍යා සන්නිවේදන සහ විද්‍යා ලේඛන වැඩසටහන් ස්ලින්ටෙක් (SLINTEC) ඇකඩමිය සමඟ සමසංවිධානය කෙරිණි.
- ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා උපාධි අපේක්ෂක සිසුන් හට සිය අවසන් වර්ෂයේ පර්යේෂණ සිදුකිරීම සඳහා තොරතුරු තාක්ෂණ විද්‍යාගාරයක් භාවිතයට ගැනීම සඳහා පහසුකම් සලසා දීම.

3.3.1.6 ද්විපාර්ශ්වික සහයෝගීතාවය

- **ඉන්දු - ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන**

අමාත්‍යාංශය සහ ඉන්දියානු විද්‍යා හා තාක්ෂණ දෙපාර්තමේන්තුව අතර අත්සන් තබනු ලැබූ සහයෝගීතා වැඩසටහන අනුකූලව, ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘති 18 ක් සහ ඒකාබද්ධ වැඩමුළු 2 ක් සමාලෝචිත කාල සීමාව තුලදී ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගනු ලැබිණි.

ඉන්දු ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘතීන්හි ද්විවාර්ෂික ප්‍රගති සමාලෝචන රැස්වීම 2018 ජූලි මස දී පවත්වනු ලැබිණි.

"ධීවර කර්මාන්තයේ දී සහ ජලජ ජීවී වගාවේ දී රොබෝ තාක්ෂණය සඳහ ස්වයංක්‍රීයකරණය පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම සහ හුවමාරු කිරීම" පිළිබඳ ඉන්දු - ශ්‍රී ලංකා ඒකාබද්ධ වැඩමුළුව 2018 වසරේ දෙසැම්බර් මස ඉන්දියාවේදී පවත්වනු ලැබිණි.

- **ඉන්දියානු විද්‍යාත්මක සහ පර්යේෂණ අධි ශිෂ්‍යත්ව වැඩසටහන (ISRF)**

ඉන්දියානු විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය මඟින් "ඉන්දියානු විද්‍යාත්මක හා පර්යේෂණ අධිශිෂ්‍යත්ව (ISRF)" වැඩසටහන් හරහා ශ්‍රී ලාංකික විද්‍යාඥයින් හා පර්යේෂකයින් සඳහා අධිශිෂ්‍යත්ව පිරිනැමීමේ වැඩසටහන් ආරම්භ කර ඇත. මෙම වැඩසටහන යටතේ අයදුම්පත් 2 ක්, අධිශිෂ්‍යත්ව අනුමැතිය සඳහා ඉන්දියානු බලධාරීන් වෙත යොමුකර ඇත.

- **න්‍යෂ්ටික පර්යේෂණ පිළිබඳ යුරෝපා සංවිධානයේ (CERN) අධිශක්ති අධ්‍යයනයන් පිළිබඳ ආචාර්ය උපාධිය දක්වා වූ පශ්චාත් උපාධි අධ්‍යයනයන්**

ශ්‍රී ලංකාව විසින් අත්සන් තබනු ලැබූ ගිවිසුමට අනුව, ස්විට්සර්ලන්තයේ න්‍යෂ්ටික පර්යේෂණ පිළිබඳ යුරෝපා සංවිධානයේ (CERN) සිදුකෙරෙන ප්‍රමුඛතම අත්හදාබැලීමක් සඳහා (CMS) සම්පූර්ණ සාමාජිකත්වය අප ලබා ඇති අතර, ඒ හරහා අධිශක්ති භෞතික විද්‍යා ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදුකිරීමේ අවස්ථාව තරුණ විද්‍යාඥයින් වෙත උදාවේ. ශ්‍රී ලාංකික තරුණ විද්‍යාඥයින් හා පර්යේෂකයින් වෙත අධිශිෂ්‍යත්ව පිරිනැමීමේ ආචාර්ය උපාධි වැඩසටහනක් CERN විසින් ආරම්භ කර ඇත. මෙම වැඩසටහන යටතේ ආචාර්ය උපාධි අධ්‍යයනයන් සිදු කිරීමට තෝරාගනු ලැබූ සිසුන් සිව් දෙනා මේ වන විට සිය ආචාර්ය උපාධි සඳහා CERN ආයතනයේ අධ්‍යයන කටයුතු වල නිරතව සිටිති.

- **ශ්‍රී ලංකාවේ ක්‍රිසෝටයිල් ඇස්බැස්ටෝස්හි ආරක්ෂිත භාවිතය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම**

අමාත්‍යාංශය සහ රුසියාවේ යුරල් වාණිජ මණ්ඩලය අතර ඇති කරගනු ලැබූ සහයෝගීතාවයන් හි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ ක්‍රිසෝටයිල් ඇස්බැස්ටෝස්හි ආරක්ෂිත භාවිතය පිළිබඳ තීරණය කරනු පිණිස ක්‍රියාකාරී කණ්ඩායමක් ස්ථාපනය කෙරිණි. දෙරටෙහිම මෙම ක්ෂේත්‍රය පිළිබඳ විද්‍යාඥයින්ගෙන් මෙම කණ්ඩායම සැදුම් ලැබ ඇත. ක්‍රියාකාරී කණ්ඩායමේ ඉල්ලීම මත, තේමාගත ක්ෂේත්‍ර 4 ක් පිළිබඳ පර්යේෂණ යෝජනා කැඳවමින් අමාත්‍යාංශය විසින් පුවත්පත් දැන්වීම් පළ කරන ලදී (ශ්‍රී ලංකාවේ ගෘහස්ථ දූහුවිලි සහ ගෘහස්ථ පරිසරයෙහි ක්‍රිසෝටයිල් ඇස්බැස්ටෝස් තන්තු සාන්ද්‍රණය සහ එහි ප්‍රතිවිපාක ශ්‍රී ලංකාවේ ඇස්බැස්ටෝස් කර්මාන්තයේ නියුතු සේවකයින් අතර පවතින ඇස්බැස්ටෝස් හා බැඳුනු වෘත්තීය සෞඛ්‍ය ගැටලු පිළිබඳ වසංගත රෝග විද්‍යාත්මක අධ්‍යයනය, ශ්‍රී ලංකාවේ පෙනහළු පිළිකා, මෙසොතෙලියෝමා සහ ශ්වසන පද්ධතිය ආශ්‍රිත ගැටලු සහ ක්‍රිසෝටයිල් ඇස්බැස්ටෝස් හා ඒවායේ සම්බන්ධතාවය ශ්‍රී ලංකාවේ පරිසරයේ වාණිජමය හා ස්වභාවික ඇස්බැස්ටෝස් තන්තු භූ විද්‍යාත්මක සමාජීය සහ පාරිසරික දැක්ම). 2018 ජූලි 23 දින, තුර්කියේ දී පැවති ක්‍රියාකාරී කණ්ඩායමේ තුන්වන හමුවේ දී මෙම යෝජනාවන් ඇගයීමට ලක් කොට තෝරාගැනීම් සිදුකරන ලදී. අමාත්‍යාංශය වෙතින් අරමුදල් ලද පසු, ජාතික පර්යේෂණ සභාව (NRC) විසින් අදාල ප්‍රධාන මෙහෙයුම් මාර්ගෝපදේශ හා අනුකූලව පර්යේෂණ ව්‍යාපෘති 4 හි ප්‍රගතිය සුපරීක්ෂණය ආරම්භ කෙරෙනු ඇත.

ක්‍රිසෝටයිල් ඇස්බැස්ටෝස් හි සුරක්ෂිත භාවිතය සඳහා වූ පළමු ප්‍රගති සමාලෝචන රැස්වීම 2018 දෙසැම්බර් මසදී පවත්වන ලදී.

- **අත්සන් තබනු ලැබූ සහ ආරම්භ කරන ලද අවබෝධතා ගිවිසුම**

I. විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ සහයෝගීතාවය පිළිබඳ ශ්‍රී ලංකා රජය සහ දකුණු අප්‍රිකා ජනරජය අතර ඇති කරගනු ලැබූ අවබෝධතා ගිවිසුම් සඳහා අත්සන් තැබීම 2018 ජනවාරි මස දකුණු අප්‍රිකාවේ ප්‍රිටෝරියාහි දී සිදුකෙරිණි.

II. ශ්‍රී ලංකා රජයේ විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සහ තායිලන්ත රජයේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය අතර විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාවය පිළිබඳ පළමු ඒකාබද්ධ කමිටු රැස්වීම, 2018 ජනවාරි මස ශ්‍රී ලංකාවේ දී පැවැත්විණි.

III. ශ්‍රී ලංකා රජයේ විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සහ කියුබානු රජයේ විද්‍යා, තාක්ෂණ හා පාරිසරික අමාත්‍යාංශය අතර විද්‍යා හා තාක්ෂණ හා පර්යේෂණ ක්ෂේත්‍රයන් පිළිබඳ ඇතිකරගනු ලැබූ අවබෝධතා ගිවිසුම යටතේ පළමු ඒකාබද්ධ කමිටු රැස්වීම 2018 ජනවාරි මස කියුබාවේ දී පැවැත්විණි.

- **වෙනත් සහයෝගීතාවයන්**

I. චීන රජයේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ සහ යුනාන් පළාත් මහජන රජයේ සම අනුග්‍රාහකත්වය යටතේ, 2018 ජූනි මස දී කුන්මින්ග් හිදී පවත්වනු ලැබූ චීන දකුණු ආසියානු තාක්ෂණ පැවරුම් සහ සහයෝගීතා නවෝත්පාදන පිළිබඳව තුන්වන සම්මන්ත්‍රණය සඳහා ගරු අමාත්‍යතුමන් සහ ශ්‍රී ලාංකික නියෝජිතයන් සහභාගී විණි.

II. ඉක්වදෝරය, බෙලරුස්, ලැට්වියා, නවසීලන්තය, ස්ලෝවේනියා, වියට්නාමය, නේපාලය සහ ඉන්දුනීසියාව යන රටවල් සමඟ විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන පිළිබඳ සහයෝගීතාවයන් ඇතිකර ගැනීම සඳහා සාකච්ඡා සිදුකෙරේ.

- **නොබැඳි ජාතීන්ගේ සහ වෙනත් සංවර්ධනය වෙමින් පවතින රටවල් හි විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයෙහි 14 වන පාලක මණ්ඩලයේ පළමු රැස්වීම (NAM S&T Centre)**

නොබැඳි ජාතීන්ගේ සහ වෙනත් සංවර්ධනය වෙමින් පවතින රටවල්හි විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයෙහි 14 වන පාලක මණ්ඩලයේ පළමු රැස්වීම 2018 සැප්තැම්බර් මස දී කොළඹ දී සාර්ථකව නිමාවට පත්විය. NAM S&T මධ්‍යස්ථානයේ සාමාජික රටවල්හි (ඊජිප්තුව, ඉන්දියාව, මැලේසියාව, මුරුසිය, දකුණු අප්‍රිකාව සහ ශ්‍රී ලංකාව) සමාජිකයන් නවදෙනෙකු මෙම රැස්වීමට සහභාගී විණි.

3.3.1.7 වෙනත් සංවර්ධන මූලාරම්භයන්

- **සූර්ය පැනල මූලාකෘති නිෂ්පාදන ව්‍යාපෘතිය**

සූර්ය පැනල මූලාකෘති නිපදවීමේ ව්‍යාපෘතිය, කැළණිය, යාපනය, රුහුණ සහ පේරාදෙණිය යන විශ්වවිද්‍යාල හතරෙහි සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කරනු ලැබ ඇති අතර මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ සූර්ය පැනල සවි කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම පිළිබඳ නිපුණතා සහිත 2000 ක පමණ ශ්‍රම බලකායක් නිර්මාණය කිරීමත් එක් එක් විශ්වවිද්‍යාලයන්හි පර්යේෂණ හා සංවර්ධන පහසුකම් වැඩිදියුණු කිරීමත් හරහා රටෙහි සූර්ය බලශක්ති ආශ්‍රිත කර්මාන්ත ක්ෂේත්‍රයේ මානව සම්පත සංවර්ධනය කිරීමත්ය. කැළණිය විශ්වවිද්‍යාලය ස්ථාපනය කරනු ලැබ ඇති ව්‍යාපෘති කළමනාකරණ ඒකකය අමාත්‍යාංශයේ මාර්ගෝපදේශකත්වය යටතේ ක්‍රියාත්මක වේ. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ සිදුකරනු ලැබූ ප්‍රධාන ක්‍රියාකාරකම්හි ප්‍රගතීන් පහතින් සාරාංශගත කර ඇත.

- ගම්පහ, කොළඹ, මහනුවර, මාතර, හම්බන්තොට, ගාල්ල, යාපනය, කිලිනොච්චිය, මුලතිව්, මන්නාරම හා වව්නියාව යන දිස්ත්‍රික්කයන්හි සිසුන් 1786 දෙනෙකුගේ සහභාගිත්වයෙන් සූර්ය බලශක්තිය භාවිතය පිළිබඳ පාසල් මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් හා ප්‍රදර්ශන වැඩසටහන් 27 ක් පවත්වනු ලැබ ඇත.
- එක් එක් විශ්වවිද්‍යාලයන්හි මෙම ව්‍යාපෘතිය යටතේ කටයුතු කරන නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන්ගේ මාර්ගෝපදේශකත්වය යටතේ සහ ජාතික මූලික අධ්‍යයන ආයතනයේදී පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්හි නියැළීම සඳහා, සූර්ය බලශක්ති ක්ෂේත්‍රයේ සිය දර්ශනපති / ආචාර්ය උපාධි අධ්‍යයනයන් සිදුකරනු පිණිස එක් එක් විශ්වවිද්‍යාලයන් සඳහා පර්යේෂණ සහායකයින් බඳවාගැනීමේ අයදුම්පත් ඇගයීම සිදුකෙරේ.
- NVQ 4 මට්ටම හා සමාන වූ සූර්ය බලශක්තිය පිළිබඳ විෂයමාලාවක් වැඩිදියුණු කර ඇත. මෙම පුහුණුවෙහි ඉලක්කගත කණ්ඩායම වනුයේ සා/පෙළ අසමතුන් විශේෂ කොටගත් තරුණ ප්‍රජාවයි. මෙම පුහුණුවෙහි පළමු අදියර පෞද්ගලික අංශයේ කර්මාන්තයන්හි සහභාගීත්වයෙන් සිදුකෙරෙනු ඇත.

– මෙම පුහුණු වැඩසටහන් පැවැත්වීමට අදහස් කරන, එම පුහුණු පහසුකම් සහිත පෞද්ගලික අංශයේ කර්මාන්තයන්ට මෙම පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා ප්‍රතීතනය ලබාගනු පිණිස, තෘතීයික සහ වෘත්තීය පුහුණු අධිකාරිය (TVEC) විසින් පහසුකම් සපයා දී ඇත.

- **යාන්ත්‍ර විද්‍යාවෙන් සවිබල ගැන්වෙන ආර්ථික සංවර්ධන මූලාරම්භය (MEDI)**

යාන්ත්‍ර විද්‍යාවෙන් සවිබල ගැන්වෙන ආර්ථික සංවර්ධන මූලාරම්භය (MEDI) යනු 2016 අයවැය යෝජනාවෙන් අනුමත වූ ව්‍යාපෘතියක් වන අතර ඒ හා සම්බන්ධ මූලික කාර්යයන් 2017 වර්ෂයේදී ආරම්භ කරනු ලැබිණි. මෙම මූලාරම්භයේ ප්‍රධාන අරමුණ වනුයේ දේශීය සහ ගෝලීය වශයෙන් බලපත්‍රලාභී නිෂ්පාදකයින් සඳහා සුහුරු යන්ත්‍ර සැලසුම් නිර්මාණය හරහා අපගේ ආර්ථිකය සහ අධිතාක්ෂණික අපනයනයන් වර්ධනය කරවීමත් ආනයනයන් පහත හෙලීමත්ය. මෙම මූලාරම්භයන් හරහා, ගෝලීය මට්ටමේ ප්‍රමිතීන් සහිතව දේශීයව සහ ගෝලීය මට්ටමින් සිය නිෂ්පාදන අලෙවි කිරීම සඳහා නිෂ්පාදන සැලසුම් නිර්මාණ ඉංජිනේරු (PDE) සමාගම් සඳහා පහසුකම් සපයාදීම අරමුණු කෙරේ. මෙම මූලාරම්භයෙහි ප්‍රථම අදියර යටතේ යාන්ත්‍ර ඉලෙක්ට්‍රෝනික විද්‍යාව පිළිබඳ අවධානය යොමු කෙරෙනු ඇති අතර අනාගතයේදී වෙනත් ක්ෂේත්‍රයන්ද ආවරණය කෙරෙන පරිදි පුළුල් කෙරෙනු ඇත. මෙම මූලාරම්භය ප්‍රධාන සංරචක දෙකකින් සමන්විතය. ඒවා නම්, දීර්ඝ කාලීන ණය පහසුකම (LTLF) සහ ප්‍රමිති පුහුණු, මූලාකෘතිකරණ සහ පරීක්ෂණ පහසුකම (SPTF) වේ. LTLF සංරචකය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය දැනටමත් ලැබී ඇති අතර, එය මුදල් අමාත්‍යාංශයේ සහයෝගීතාවයෙන් "Enterprise Sri Lanka" යටතේ ක්‍රියාත්මක කෙරෙනු ඇත. මෙහි SPTF සංරචකය, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලත්වය දක්වනු පිණිස ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (NERDC) විසින් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

මෙහි ක්‍රියාකාරකම්හි සාරාංශයක් පහතින් දක්වා ඇත.

– ප්‍රමිති පුහුණු මූලාකෘතිකරණ පරීක්ෂා පහසුකම (SPTF), සඳහා වූ සවිස්තරාත්මක යෝජනාවට ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති අතර SPTF සඳහා වෙන්කර දී ඇති ප්‍රතිපාදන භාවිතයට ගනු පිණිස අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකසන ලදී.

– SPTF පහසුකම ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය කෙරෙන ප්‍රධාන සහ මූලික උපකරණ පිළිබඳ පිරිවිතරයන් සැකසීම, NERDC මධ්‍යස්ථානය විසින් දැනටමත් අවසන් කරනු ලැබ ඇත.

– හෝමාගම, පිටිපන නිනිති තාක්ෂණ හා විද්‍යා උද්‍යානයෙන් අවශ්‍ය කාර්යාල පහසුකම් දැනටමත් ලබාදී ඇත.

– මුදල් අමාත්‍යාංශය, Enterprise Sri Lanka සහ බැංකු ආයතන පහක් සමඟ පැවත්වනු ලැබූ සාකච්ඡා සාර්ථකව නිමාවට පත්විණි.

- **ජෛව තාක්ෂණ නවෝත්පාදන උද්‍යානය**

2016 අයවැය යෝජනාව හා අනුකූලත්වය දක්වමින්, රටෙහි ඇති තාක්ෂණික අපනයනයන් ඉහළ නැංවීම සඳහාත් ජෛව තාක්ෂණ ක්ෂේත්‍රයේ මානව සම්පත වර්ධනය සඳහා දායකත්වය දක්වනු පිණිස ජෛව තාක්ෂණ නවෝත්පාදන උද්‍යානයක් ස්ථාපනය කිරීමේ කාර්යයෙහි අමාත්‍යාංශය නියැලී සිටී. යෝජිත නවෝත්පාදන උද්‍යානය ස්ථාපනය සඳහා අවශ්‍ය කෙරෙන භූමිය, නාගරික සංවර්ධන අධිකාරිය විසින් දැනටමත් වෙන්කර දී ඇත. ශක්‍යතා අධ්‍යයනය සහ ප්‍රධාන / ව්‍යාපාරික සැලැස්ම වැඩිදියුණු කිරීමෙන් පසු, ව්‍යාපෘතිය සිය මෙහෙයුම් ආරම්භ කරනු ඇත.

- **පොහොර වර්ග වැඩිදියුණු කිරීම සහ පාංශු කළමනාකරණය හරහා නිසරු බිම්හි සාරවත්භාවය ඉහළනැංවීම**

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික වගාබිම් හි නිසරුභාවය හේතුකොටගෙන පැමිණි පසෙහි තත්ත්වය සහ සාරවත්භාවය වැඩිදියුණු කරනු පිණිස SLINTEC සහ NIFS යන ආයතන විසින් පර්යේෂණයන් සිදුකරන ලදී. SLINTEC ආයතනය විසින් සිදුකරනු ලැබූ පර්යේෂණයන්හි දී පසෙහි තත්ත්වයෙහි ඉහළ නැංවීම ඇගයීමට ලක්කරනු පිණිස හරිතාගාර/පාංශු බීජෞෂණ අධ්‍යයනයන් සිදු කිරීම හරහා පාංශු කළමනාකරණය පිළිබඳ අවධානය යොමු කෙරිණි. NIFS ආයතනය විසින්, ජෛව පටල, ජෛව පොහොර සහ රයිසෝබියම් ජෛව පොහොර වැනි වැඩිදියුණු කළ ජෛව පොහොර වර්ගයන් සංවර්ධනය කරනු පිණිස සිය පර්යේෂණයන් සිදුකරන ලදී.

3.4 අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණනය යනු ආයතනයක සමස්ත කාර්යක්ෂමතාවය සහතික කරනු පිණිස ආයතනික පද්ධති සහ පටිපාටියන් කලින් කලට සමාලෝචනයට ලක් කිරීමයි. මෙය දෝෂ සහගත, අකාර්යක්ෂම සහ වංචනික ක්‍රියාවන් ආවරණය කර ගැනීම සහ ඒවා නිරවද්‍ය කරගැනීම සඳහා භාවිතා කරන මෙවලමකි. මූලික වශයෙන් අභ්‍යන්තර විගණනයේ දී සිදුවනුයේ, ක්‍රියාකාරකම්හි/මෙහෙයුම්හි ඵලදායිතාවය සහ කාර්යක්ෂමතාවය, මූල්‍ය වාර්ථාකරණයෙහි විශ්වාසනීයත්වය, නීතිරීති හා අනුකූලත්වය යනාදිය සහතික කරනු පිණිස පද්ධතියෙහි අභ්‍යන්තර පාලනය වැඩිදියුණු කිරීමයි.

අභ්‍යන්තර විගණන අංශය, ප්‍රධාන අභ්‍යන්තර විගණක, සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකුගෙන් එක් කළමනාකරණ සහකාර වරයෙකුගෙන් සහ එක් අභ්‍යාසලාභී පරිගණක ක්‍රියාකරුවෙකුගෙන් සමන්විතය. මෙම අංශයෙහි ප්‍රධාන වගකීම වනුයේ, අභ්‍යන්තර පාලන පද්ධතියේ සහ එහි ඵලදායීතාවට සනාථ කිරීම, සංඛ්‍යා ලේඛන සැසඳීම, විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් එවන ලැබූ විගණන වාර්තා සඳහා පිළිතුරු කෙටුම්පත් කිරීම සහ අමාත්‍යාංශය වෙත ලැබෙන පෙත්සම් සම්බන්ධයෙන් කටයුතු කිරීමයි.

මෙම අමාත්‍යාංශය යටතේ ආයතන 13 ක් ක්‍රියාත්මක කෙරෙන අතර ඒ අතරින් ආයතන තුනක, එනම් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම (NASTEC), ශ්‍රී ලංකා නව නිපයුම්කරුවන්ගේ කොමිසම (SLIC), සහ ජාතික පර්යේෂණ සභාව (NRC), සඳහා ඔවුන්ගේම අභ්‍යන්තර විගණන අංශයක් නොමැත. එබැවින්, මෙම අංශය විසින්, එකී ආයතන ත්‍රිත්වය සඳහා විගණන කාර්යය සිදුකරනු ලබයි. විගණන හා කළමනාකරණ කමිටු තුනක් පවත්වා ඇත. සාමාන්‍ය විගණන විමසුම් 10 ක් ලද අතර නවයක් සඳහා පිළිතුරු සපයා ඇත.අභ්‍යන්තර විගණන විමසුම් නවයක් ලද අතර මෙම විමසුම් නවය සඳහාම පිළිතුරු සපයා ඇත.

3.5 විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ලේකම් කාර්යාලයේ (COSTI) සංවර්ධන මූලාරම්භයන්

- විද්‍යා, තාක්ෂණ සහ නවෝත්පාදන ලේකම් කාර්යාලය (COSTI) විසින් වනසම්පත් සහ පරිසර විද්‍යා දෙපාර්තමේන්තුව හා අනුබද්ධිතව දැව සැකසුම් නවෝත්පාදක මධ්‍යස්ථානය (TPIC) ස්ථාපනය කරනු පිණිස ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමඟ 2018 ඔක්තෝබර් 26 දින අවබෝධතා ගිවිසුමකට එළැඹිණි.
- COSTI විසින් ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාකාරී සැලසුම සකස් කර අවසන් කරනු ලැබ ඇති අතර එය ජනාධිපති කාර්යාලයටද ඉදිරිපත් කරනු ලැබ ඇත.
- **EIE** ව්‍යාපෘතියෙහි බුද්ධිමය දේපළ වාණිජකරණය පිළිබඳ සාකච්ඡා පවත්වා ඇත.
- බුද්ධිමය දේපළ පිළිබඳ දෙවැනි ජාතික වැඩමුළුව 2018 සැප්තැම්බර් 17 සිට 21 දක්වා බත්තරමුල්ල වෝටර්ස් එජ්හිදී පැවැත්විණි**.**
- පේටන්ට් සෙවීම, පේටන්ට් කෙටුම්පත් කිරීම, ආයතනික බුද්ධිමය දේපළ ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීම, තාක්ෂණ පැවරීම පිළිබඳ බුද්ධිමය දේපළ දැනුම බෙදාදීම සඳහා බුද්ධිමය දේපළ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් COSTI විසින් ක්‍රියාත්මක කරන ලදී. 2018 වර්ෂය සඳහා රුහුණු විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේදී සහ වෛද්‍ය පීඨයේදී සහ SLIIT ආයතනයේදී දින දෙකක වැඩසටහනක් පවත්වන ලදී.
- දේශීය පේටන්ට් පටිපාටි සහ බුද්ධිමය දේපළ භාවිතය පිළිබඳ නවනිපැයුම්කරුවන් 10 දෙනෙකු සඳහා මාර්ගෝපදේශ ලබාදෙන ලදී. පේටන්ට් සෙවිම් පහක් සිදුකරනු ලැබූ අතර පේටන්ට් කෙටුම්පත් දෙකක් සඳහා සහාය ලබාදෙන ලදී.
- COSTI විසින් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ අනුග්‍රාහකත්වය යටතේ සමාජය වෙත විද්‍යාව සංනිවේදන කිරීම අරමුණු කර ගනිමින්, “අනන්තය” නමින් ගුවන්විදුලි වැඩසටහනක්, සෑම සඳුදා සහ බදාදා දිනකම ප.ව. 6.30 සිට ප.ව. 7.30 දක්වා හර්ට්ස් 89.6 හෝ 89.8 ඔස්සේ සිටි එෆ්. එම්. ඔස්සේ විකාශය කිරීම ආරම්භ කරන ලදී.

3.6 ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය

තාරකා විද්‍යා ක්ෂේත්‍රය පිළිබඳ මහජනතාව අතර උද්යෝගය වර්ධනය කිරීම හරහා 2018 වසර සඳහා වූ අරමුණු සාර්ථකව අත්කර ගැනීමට ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරයට හැකි වී ඇත. 2018 වසර සඳහා ලද මුළු ආදායම රුපියල් මිලියන 15.926 කි. තාරකා විද්‍යා පිළිබඳ නවතම දැනුම, සහ නව සොයාගැනීම් මහජනතාව සමඟ බෙදාගනු පිණිස ග්‍රහලෝකාගාර දර්ශන, එළිමහන් වැඩසටහන්, තාරකා විද්‍යා පන්ති, සම්මන්ත්‍රණ සහ වෙනත් ක්‍රියාකාරකම් සිදුකරන ලදී.

3.6.1 ග්‍රහලෝකාගාර දර්ශන

2018 වර්ෂය මුළුල්ලේ පාසල් සිසුන් සහ මහජනතාව සඳහා තාරකා විද්‍යාව හා සම්බන්ධිත 3-D චිත්‍රපට, “සෞරග්‍රහ මණ්ඩලය පිළිබඳ හඳුන්වාදීම” සහ “ අද දින රාත්‍රී අහස” පිළිබඳ ඉදිරිපත් කිරීම යනාදිය ඇතුළත් ග්‍රහලෝකාගාර දර්ශන **පවත්වන ලදී.**



ග්‍රහලෝකාගාර දර්ශන

3.6.2 එළිමහන් වැඩසටහන්

තාරකා විද්‍යාව ප්‍රචලිතකිරීම සමාජ වගකීම් ලෙස සලකමින්, ජංගම ග්‍රහලෝකාගාර දර්ශන, රාත්‍රී අහස නිරීක්ෂණ කඳවුරු, ප්‍රදර්ශන කුටි සහ වෙනත් ක්‍රියාකාරකම් නොමිලේ පවත්වන ලදී.



එළිමහන් වැඩසටහන්

3.6.3 තාරකා විද්‍යා පන්ති සහ සම්මන්ත්‍රණ

තාරකා විද්‍යා සහ අභ්‍යවකාශ විද්‍යාව පිළිබඳ උනන්දුවක් ප්‍රදර්ශය කළ සිසුන් 170 දෙනෙකු විසින් “Astro- IT” සහ “Astro Kids” වැඩසටහන් සාර්ථකව සම්පූර්ණ කරනු ලැබිණි.

ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය විසින් 100කට අධික සිසුන් සංඛ්‍යාවක් සඳහා තාරකා විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර ඔලිම්පියාඩ් විභාගය සඳහා සම්මන්ත්‍රණ පවත්වන ලදී.

වගුව: 2018 වර්ෂය සඳහා ග්‍රහලෝකාගාරයේ ක්‍රියාකාරකම් ප්‍රගතිය

ක්‍රියාකාරකම්	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගීවූවන්ගේ සංඛ්‍යාව	මුළු ආදායම (රු.මි.)
ග්‍රහලෝකාගාර දර්ශන	647	282,390	**15.926**
ජංගම ග්‍රහලෝකාගාර දර්ශන	94	4,100	නොමිලේ පවත්වන ලදී
රාත්‍රී අහස නිරීක්ෂණ කඳවුරු	11	1,805	
ප්‍රදර්ශන කුටි	2	4,500	
තාරකා විද්‍යා පන්ති	2	170	
තාරකා විද්‍යා සම්මන්ත්‍රණ	8	100	

3.6.4 නවීකරණයන්

ඩෝමය වෙත ප්‍රවිෂ්ඨ වීම සඳහා අලුතින් ඉදිකරනු ලැබූ ප්‍රවේශ මාර්ගය, ග්‍රහලෝකාගාරය වෙත පැමිණෙන නරඹන්නන් හට ආකර්ශනීය අත්දැකීමක් ලබා දෙයි.



නව ප්‍රවේශ මාර්ගය

3.7 ශ්‍රී ලංකා නිනිති තාක්ෂණ ආයතනය (SLINTEC)

2007 වර්ෂයේදී රාජ්‍ය - පෞද්ගලික සහයෝගීතාවයක් ලෙස ස්ථාපනය කරනු ලැබූ ස්ලින්ටෙක් ආයතනය, 2008 වර්ෂයේදී පර්යේෂණ හා සංවර්ධන ආයතනයක් ලෙස සිය මෙහෙයුම් ආරම්භ කළේය.නිනිති තාක්ෂණය සහ උසස් තාක්ෂණයන් භාවිතය හරහා දේශීය ඛනිජ සම්පත් සඳහා අගයන් එකතු කිරීමේ හැකියාව ලබා දීම සහ ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සහ අපනයන අංශය සඳහා සහාය දැක්වීම යන නිශ්චිත අරමුණ මුල් කරගනිමින් මෙම ආයතනය ස්ථාපනය කරනු ලැබිණි.

ස්ලින්ටෙක් ආයතනයෙහි 50% ක කොටස් හිමිකාරිත්වයක් ජාතික විද්‍යා පදනම හරහා ශ්‍රී ලංකා රජය සතුවන අතර ඉතිරි 50% ක කොටස් හිමිකාරිත්වය පෞද්ගලික අංශයේ ආයතන 7 ක් විසින් දරයි. එම ආයතන වනුයේ, බ්‍රැන්ඩික්ස්, ඩයලොග්, හේලීස්, ලෝඩ්ස්ටාර්, මාස්, ලංකෙම් සහ එල්.ඕ.එල්.සී යන සමාගම්ය. රජය විසින් යටිතල පහසුකම් සඳහා මූල්‍යමය සහාය ලබාදීමේ වගකීම දරමින්, පෞද්ගලික අංශය සමග එක්ව මෙම සමාගමෙහි මෙහෙයුම් වියදම් සඳහා සහාය ලබාදෙනු පිණිස අවශ්‍ය ප්‍රාග්ධනයද ලබාදෙන ලදී. මෙයට අමතරව, පෞද්ගලික අංශය විසින් මෙම ආයතනයට නායකත්වය සහ යහපාලනය ලබාදෙයි. මෙම සමාගම පෞද්ගලික සමාගමක් ලෙස සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇත.

3.7.1 මේ දක්වා අත්කරගනු ලැබ ඇති ප්‍රධාන ජයග්‍රහණ

ආරම්භයේ සිට, 2018 දෙසැම්බර් 31 දින දක්වා ආයතනය විසින් පහත පරිදි ආදායම් උපයාගනු ලැබ ඇත.

පෞද්ගලික අංශයේ දායකත්වය

- කොටස් ප්‍රාග්ධන රු.මිලියන 415.
- ගිවිසුම්ගත පර්යේෂණ ආදායම ආසන්න වශයෙන් රු.මිලියන 282. (සේවාදායකින් සංඛ්‍යාව 41)
- උපකරණ සඳහා දායකත්වය ආසන්න වශයෙන් රු.මිලියන 57.
- පේටන්ට් බලපත්‍ර විකිණීම සහ කතෘභාග ආදායම් ආසන්න වශයෙන් ඇ.ඩො.මිලියන 1.4. (වත්මන් විනිමය අනුපාත වලට අනුව රු.මිලියන 250 කට ආසන්න වේ.) මෙයට අමතරව, අලුතින් පිහිටවනු ලැබූ සී/ස සිලොන් ග්‍රැෆීන් ටෙක්නොලොජීස් (පෞද්) සමාගම වෙත ග්‍රැෆයිට් පිළිබඳ පේටන්ට් බලපත්‍රය පවරා දී ඇත. මෙම නව සමාගමෙහි වටිනාකම ඇ.ඩො.මිලියන 2.35 කි.(ආසන්න වශයෙන් රු.මිලියන 418 ක් වන අතර මෙම සමාගමෙහි 15% ක හිමිකාරිත්වයක් ස්ලින්ටෙක් සමාගම සතුව ඇත)
- වත්මන් වන විට ආසන්න වශයෙන් රු.මිලියන 53.3 දක්වා වර්ධනය වී ඇති ලාභ ඉපයීමක් ස්ලින්ටෙක් අනුරක්ෂණ භාරකාර අරමුදල සතුව ඇත.

රාජ්‍ය අංශයේ දායකත්වය

- රු.මිලියන 565 ක කොටස් ප්‍රාග්ධනයක් සහ රු. මිලියන 184 ක ගිවිසුම්ගත පර්යේෂණ ගෙවීම් කර ඇත.
- ගෙඩනැගිලි, උපකරණ සහ හෝමාගම පිටිපන පිහිටි බිම් කොටස යන යටිතලයන් සඳහා සම්පූර්ණ අරමුදල් රජය විසින් ලබා දී ඇත.

මූල්‍යමය නොවන දායකත්වය / බලපෑම

- විද්‍යා උද්‍යානය තුළ සිය අතිනවීන ඖෂධවිද්‍යාත්මක පර්යේෂණ සහ නිෂ්පාදන මෙහෙයුම් ස්ථාපනය කර ගැනීමට, හේමාස් හෝල්ඩින්ස්හි කොටස්කරුවෙකු වන මොරිසන්ස් සමාගම (පෙර ජේ.එල් මොරිසන්ස්) ආකර්ශනය කරගන්නා ලදී. 2019 වර්ෂයේ තෙවැනි කාර්තුව වන විට ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීමට අපේක්ෂිත අතර 2020 වර්ෂයේ තෙවැනි කාර්තුව වන විට බලාගාරයෙහි මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීම ආරම්භ කෙරෙනු ඇත.
- ජෝන් කීල්ස් සහ එල්.ඕ.එල්.සී යන සමාගම් (ප්‍රධාන වශයෙන් සේවා සැපයීම මත පදනම් වූ සහ කොළඹ කොටස් වෙළඳපළෙහි විශාලතම ප්‍රාග්ධනික සමාගම් ද්විත්වය වූ) විද්‍යාත්මක පර්යේෂන ක්ෂේත්‍රයන්හි විවිධාංගීකරණය සඳහා මූලික වූ අතර මෙම සමාගම් ද්විත්වයම නිතිති තාක්ෂණ හා විද්‍යා උද්‍යානයෙහි සිට සිය මෙහෙයුම් ක්‍රියාක්මක කරයි.
- පර්යේෂණ මත පදනම් වූ දර්ශනපති/ ආචාර්ය උපාධි සපයාදීම සඳහා ලාභ ඉපයීමක් සිදුනොවන ආයතනයක් ලෙස ස්ලින්ටෙක් ඇකඩමිය ස්ථාපනය කෙරිණි. මේ වන විට සිසුන් 21 දෙනෙකු බඳවා ගනු ලැබ ඇත.
- ස්ලින්ටෙක්හි සිදුකෙරෙන විද්‍යාගාර මට්ටමේ පර්යේෂණයන්ගෙන් බිහිවන විවිධ ව්‍යාපෘතීන් පවත්වා ගෙන යාම සඳහා තාක්ෂණ බීජෞෂණ මධ්‍යස්ථායක් (TIC) ස්ථාපනය කෙරිණි. මෙයට අමතරව TIC හි පවතින ඉඩපහසුකම්, ජොන් කීල්ස් රිසර්ච් සමාගමට සහ එල්.ඕ.එල්.සී යන සමාගම සඳහා විද්‍යාගාර ස්ථාපනය කරගනු පිණිස ලබාදීමට කටයුතු කර ඇත. CIC සමාගමද වසරක කාලයක් සඳහා ඉඩපහසුකම් ලබාගත් නමුත් ඔවුන්ගේ ඉදිරි පර්යේෂණ හා සංවර්ධන සැලසුම් කෙටිකලකට ක්‍රියාත්මක කිරීමෙන් වැළකීමට තීරණය කර ඇත. මෙයට අමතරව ක්‍රියාකාරී ඖෂධ විද්‍යාත්මක අමුද්‍රව්‍ය නිෂ්පාදන ශාක්‍යතා ඒකකය සහ කෘතිම ජෛවවිද්‍යා වැඩසටහන මෙම එකම පහසුකමෙහි ස්ථාපිතව ඇත.

- නිනිති තාක්ෂණ සහ විද්‍යා උද්‍යානයෙහි තාක්ෂණ බීජෞෂණ මධ්‍යස්ථානය තුළ ශ්‍රී ලංකාවේ ප්‍රථම ක්‍රියාකාරී ඖෂධ විද්‍යාත්මක අමුද්‍රව්‍ය නිෂ්පාදන ශක්‍යතා ඒකකය ස්ථාපනය කරනු ලැබිණි.

පේටන්ට් බලපත්‍ර, ප්‍රකාශන සහ ආදායම

- ස්ලින්ටෙක් විසින් පේටන්ට් බලපත්‍ර 15 ක් ගොනු කර ඇති අතර ඉන් 13 ක් එක්සත් ජනපදයේදී ද, දෙකක් ශ්‍රී ලංකාවේදී ද සිදු කෙරිණි. 2018/2019 වර්ෂයන්හිදී පේටන්ට් බලපත්‍ර හයක් ද දේශියව බලපත්‍ර දෙකක් ද ගොනු කිරීමට අපේක්ෂිතය.
- පේටන්ට් පවරා දීමෙන් එ.ජ.ඩොලර් මිලියන 1.35 කට ආසන්න මුදලක් උත්පාදනය කරගනු ලැබූ අතර පිහිටුවාගත් පළමු සමාගම වූ සී/ස සිලෝන් ග්‍රැෆීන් ටෙක්නොලොජීස් (පෞද්) සමාගමෙහි කොටස් ලෙස එ.ජ.ඩොලර් 350,000 ක්ද උත්පාදනය කරගැණිනි.
- සාර්ථක පර්යේෂණ ව්‍යාපෘතීන් වෙතින් රු.මිලියන 7.8 කට ආසන්න ප්‍රථම කතෘභාග ආදායම උපයාගැනීමට සමත් වී ඇත. (සේවාදායකයාගේ ප්‍රතිලාභය ආසන්න වශයෙන් රු.මිලියන 40 කි)
- පෞද්ගලික අංශයේ හවුල්කරුවන් සමඟ සිදුකළ ගිවිසුම් ගත පර්යේෂණයන් වෙතින් සහ විද්‍යා, තාක්ෂණ පර්යේෂණ අමාත්‍යාංශය සමඟ සිදුකළ ක්‍රමෝපායික පර්යේෂණ ව්‍යාපෘති ඇසුරින් රු.මිලියන 466 කට ආසන්න මුදලක් උත්පාදනය කරගැණිනි.
- ප්‍රථම වාණිජ නිෂ්පාදනය 2019 පෙබරවාරි මසදී දියත් කිරීමට අපේක්ෂිතය.
- පිළිගත් ජාත්‍යාන්තර ජර්නලයන්හි මේ දක්වා පත්‍රිකා 84 ක් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත.

2018 දෙසැම්බර් 31 දිනට ස්ථාපනය කරගනු ලැබූ සහයෝගීතාවයන්, අනුරක්ෂණයන් සහ කාර්යමණ්ඩල සවිය

- **සහයෝගීතාවයන්**

– ශ්‍රී ලංකා ඉල්මනයිට්, ටයිටේනියම් ඩයොක්සයිඩ් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමේ නියාමන බලාගාරයක් ස්ථාපනය කරගනු පිණිස, ලාෆ්ස් ගෑස් සමාගම සමඟ ගිවිසුමකට එළැඹිණි. (මෙම මූලාරම්භය සඳහා සහාය පළකරනු පිණිස රු.මිලියන 57 කට ආසන්න මුදලක් සේවාදායකයා විසින් යොදවා ඇත) මෙම කාර්යය සාර්ථකව අවසන් කරනු ලැබිණි.

– ශ්‍රී ලංකාවේ මිනිරන් පතල් ඇසුරෙන් ලබාගැනෙන මිනිරන් භාවිතයෙන් ඉතා ඉහළ තත්ත්වයේ ග්‍රැෆීන් නිෂ්පාදනය කිරීම වාණිජකරණය සඳහා එල්.ඕ. එල්.සී සමඟ නව හවුල් ව්‍යාපාරයක් ආරම්භ කිරීම. (සිලොන් ග්‍රැෆීන් ටෙක්නොලොජීස්හි 15% ක කොටස් හිමිකාරීත්වයක් සහිත)

– දේශීය විශ්වවිද්‍යාල කිහිපයක් සහ සිංගප්පූරුවේ නැන්ග්යැන්ග් තාක්ෂණ විශ්වවිද්‍යාලය (NTU) සමඟ අවබෝධතා ගිවිසුම්වලට එළැඹී අතර චීනයේ, කුන්මින්ග් හි යුනාන් ග්‍රාමීය විද්‍යා හා තාක්ෂණ සේවා මධ්‍යස්ථානය සහ යුරෝපයේ විශාලතම ව්‍යවහාරික පර්යේෂණ සමාගම වන ජර්මනියේ Fraunhofer Institute සමඟ සහයෝගීතා ගිවිසුම්වලට එළැඹිණි.

- **අනුරක්ෂණය**

අනුරක්ෂණ අරමුදලක් පිහිටුවා රු.මිලියන 53.27 ක මුදලක් ඒකරාශී කර ගැණිනි. මෙහිදී එක් ප්ලැටිනම් අනුග්‍රාහකයකු (මිලියන 25), එක් රන් අනුග්‍රාහකයකු (රු.මිලියන 15), එක් රිදී අනුග්‍රාහකයකු (රු.මිලියන 5), සහ Brick for Science සඳහා දායකත්වය දැක්වූවන් (රු.මිලියන 1 බැගින්), මිලියන දෙකට අඩු පෞද්ගලික දායකත්වයන්, ඇසුරෙන් මෙම අරමුදල ගොඩනහා ගැණිනි.

- **2018 දෙසැම්බර් 31 දිනට කාර්යයමණ්ඩල සවිය**

ස්ලින්ටෙක් ආයතනය විසින් දැනට 87 දෙනෙකුගෙන් යුතු කාර්යය මණ්ඩලයක් සේවයේ යොදවයි. ඉන් 62 දෙනෙකු විද්‍යා හා ඉංජිනේරු ක්ෂේත්‍රය හා සම්බන්ධිතව කටයුතු කරන අතර ආචාර්ය උපාධිධාරීන් 24 දෙනෙකු මේ අතරට ගැනේ.

3.7.2 නිනිති තාක්ෂණ සහ විද්‍යා උද්‍යාන සංවර්ධනය

2013 ඔක්තෝම්බර් 21 දින අක්කර 56 ක විශාලත්වයෙන් යුතු නිනිති තාක්ෂණ හා විද්‍යා උද්‍යානය වෙත ආයතනය ගෙන යන ලදී. මේ වන විට 48% ක ප්‍රමාණයක්, දැනටමත් භාවිතයට ගනු ලැබ ඇති අතර 18% කට ආසන්න ප්‍රමාණයක් භාවිතයට ගැනීම සඳහා ඉල්ලීම් කර ඇත. මේ වන විට ඒ පිළිබඳ සාකච්ඡාවන් සිදු කෙරෙමින් පවතී.

මෙම බිම් කොටසින් අක්කර 7 කට ආසන්න ප්‍රමාණයක් ජෛව තාක්ෂණ මූලාරම්භය සඳහා වෙන් කරනු ලැබ ඇත. මෙම ව්‍යාපෘති සමහරක් පහතින් දක්වා ඇත.

- අක්කර 6 ක් කිරුම් සහ මිනුම් පහසුකම සඳහා පවරා දෙනු ලැබ දැනට භාවිතයේ පවතී.
- අක්කර 2 ක්, ආරක්ෂක අමාත්‍යාංශයේ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සඳහා ලබා දී ඇත.
- අක්කර 7.5 ක්, ස්ලින්ටෙක් විශිෂ්ඨත්ව මධ්‍යස්ථානය, ගොඩනැගිලි පුළුල් කිරීම, නැවතීමේ ගොඩනැගිලි සහ පොදු ආපනශාලා පහසුකම සඳහා ලබා දී ඇති අතර අනාගත පුළුල් කිරීම් සඳහා අක්කර 6.1ක් වෙන්කරනු ලැබ ඇත.
- අක්කර 3.4 ක් තාක්ෂණ බීජෞෂණ මධ්‍යස්ථානය සඳහා අතිනවීන හරිතාගාරය සඳහා ලබා දී ඇත.
- අක්කර 5 ක් මොරිසන්ස් (පෞද්) සමාගම සඳහා ඔවුන්ගේ අතිනවීන පර්යේෂණ සහ නිෂ්පාදන පහසුකම ස්ථාපනය සඳහා ලබාදී ඇත. අතිරේකව අක්කර 2 ක් වාචිකව ඉල්ලා ඇත.විධිමත් පරිදි ඉල්ලීම සිදු කිරීම අපේක්ෂාවෙන් සිටිමු.
- අක්කර 7 ක් විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ඉල්ලීම මත ජෛවතාක්ෂණ මූලාරම්භය සඳහා වෙන්කරනු ලැබ ඇත.
- අක්කර 1 ක් එල්.ඕ.එල්.සී සමඟ ස්ථාපනය කරගනු ලැබූ ගෘහීන් ව්‍යාපෘතිය සඳහා වෙන්කරනු ලැබ ඇත. මේ පිළිබඳ කටයුතු අවසන් කිරීමට නියමිතව ඇත.
- අතිරේක අක්කර 2 ක් සඳහා එල්.ඕ.එල්.සී. සමාගම විසින් ඉල්ලීමක් කර ඇත. මේ පිළිබඳ කටයුතු අවසන් කිරීමට නියමිතව ඇත.
- මාර්ගය සහ පොදු භාවිතය සඳහා අක්කර 3.2 ක් වෙන් කරනු ලැබ ඇත

3.7.3 බුද්ධි ප්‍රතිග්‍රහණය

ඇමරිකා එක්සත් ජනපදය, යුරෝපය, ජපානය, කොරියාව සහ ඕස්ට්‍රේලියාව යන රටවල්හි සිට ආචාර්ය උපාධි සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික විද්‍යාඥයින්ගේ 22 ක් නැවත මෙරට වෙත ආකර්ශනය කරගැනීම.

3.7.4 වෙනත් ක්‍රියාකාරකම්

ස්ලින්ටෙක් විසින් සිදුකරනු ලැබූ දැනුම්වත් කිරීමේ වැඩසටහන් රාශියක් හරහා රටෙහි පර්යේෂණ භූදර්ශනය වෙනස්කරනු පිණිස සැලකිය යුතු අන්දමින් දායකත්වයක් ලබාදී ඇත.

- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක ක්ෂේත්‍රය සමඟ කටයුතු කිරීම හරහා, අපනයන සංවර්ධන මණ්ඩලය, ජාතික අපනයන මණ්ඩලය සහ ඖෂධ නිෂ්පාදකයින්ගේ සමාගම සඳහා සහාය ලබාදෙන ලදී.

- දේශීය සහ ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයන් සමඟ සහයෝගීතා වැඩසටහන් පැවැත්වීම සඳහා එක්ව කටයුතු කරනු ලැබේ. මෙම විවෘත පර්යේෂණ වැඩසටහන් වලදී, ස්ලින්ටෙක් විසින් ජාතික විද්‍යාගාරයක කාර්යභාරය ඉටුකරයි.
- අර්ථදායක පර්යේෂණ සිදුකරනු පිණිස සිය උපකරණ මූලාශ්‍රයන් භාවිතයට ගැනීමට, විශ්වවිද්‍යාලයන් වෙත අවකාශය ලබාදෙනු ලැබේ.
- ශ්‍රී ලංකාව තුළ වැඩිදියුණු කෙරෙන නවෝත්පාදන සහ ව්‍යවසායකත්ව වැඩසටහන් සඳහා සහාය ලබා දීම.
- 2015 මාර්තු මසදී එක්සත් ජනපදයේ හරිත ගොඩනැගිලි කවුන්සිලය විසින් ස්ලින්ටෙක් ආයතනය වෙත නව ඉදිකිරීම් සඳහා වන "බලශක්ති සහ පාරිසරික සැලසුම් නිර්මාණයන්හි නායකත්වය" (LEED) යටතේ ප්ලැටිනම් සහතිකය පිරිනමා ඇත. LEED සහතිකකරණය මඟින්, තිරසර සැලසුම් නිර්මාණය සඳහා ප්‍රදර්ශනාත්මක නිදර්ශනයක් ලෙස නිනිති තාක්ෂණ විශිෂ්ටත්ව මධ්‍යස්ථානය හඳුනාගැනේ.

3.8 2018 වර්ෂයේ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම

ආයෝජන අංකය	යෝජනාව	ක්‍රියාත්මක කිරීමේ ආයතනය	සමස්ත වෙන්කිරීම් (රු.මි.)	වියදම (රු.මි.)	ප්‍රගතිය
47	නීල හරිත ආර්ථිකයක් සඳහා කාර්යමාත්‍ර ආයතනයක් ස්ථාපනය කිරීම	අමාත්‍යාංශය	25	0	අමාත්‍යමණ්ඩල සංදේශය අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබ ඇත.
54	නිසරු බිම්හි පසෙහි තත්ත්වය වැඩිදියුණු කිරීම	SLINTEC/ITI / NIFS	50	38.6	ස්ලින්ටෙක් - හරිතාගාර / පාංශු බීජෞෂණ අධ්‍යයනයන් සිදුකිරීම හරහා ක්ෂුද්‍ර ජීවීන් එක් කිරීම මඟින් පසෙහි තත්ත්වය වැඩිදියුණු කිරීම ඇගයීමට ලක්කොට ඇත. තවද ක්ෂුද්‍ර ජීවීන් එක් කිරීමෙන් පසු ඇතිවිය හැකි ප්‍රභේදන පිළිබඳ පරීක්ෂා කරනු පිණිස පාංශු ක්ෂුද්‍ර ජීවී ප්‍රජා සංයුතිය ඇගයීමට ලක්කරනු පිණිස පරීක්ෂාවන් ආරම්භ කොට ඇත. NIFS - මහව ප්‍රදේශයේ සිදුකරනු ලබන ක්ෂේත්‍ර පරීක්ෂාව මනාව ක්‍රියාත්මකව පැවතිණි. කෙසේවුවද, එම ප්‍රදේශයේ පැවති නියං තත්ත්වය හේතුවෙන් උග්‍ර බලපෑමකට ලක්වීම නිසා අත්හැර දැමීමට සිදුවිය. ගම්පොල සහ දවුලාගල ප්‍රදේශයේ ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රදර්ශන ක්ෂේත්‍ර පරීක්ෂා දෙකෙන් හොඳ ප්‍රතිඵලයන් අත්කරගනු ලැබූ අතර මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් එන්නත් සඳහා ඇණවුම් ලබාදී ඇත. මහඉලුප්පල්ලම ප්‍රදේශයේ හරිතාගාර තත්ත්ව යටතේ සිදුකරනු ලැබූ පරීක්ෂා ඇසුරින් දිරිමත් කරවන අන්දමේ ප්‍රතිඵල අත්කරගනු ලැබූ අතර එන්නත් කිරීම හේතුවෙන් නියං ප්‍රතිරෝධී වගාවන්

					සඳහා එළිමහන් ක්ෂේත්‍ර පරීක්ෂාවන් ආරම්භ කරනු ලැබිණි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සෝයා බෝංචි ව්‍යාප්ති වැඩසටහන සඳහා එන්නත් භාවිතය අඛණ්ඩව සිදුකෙරේ. හරිතාගාරය ඉදිකිරීමේ කටයුතු සම්පූර්ණ කිරීමට ආසන්නව පවතී. Aspergillus niger හි වඩාත් කාර්යක්ෂම P - ද්‍රාව්‍ය වෙන්කිරීම් සඳහා Azolla හි භාවිතය සාර්ථක වී ඇති අතර මේ පිළිබඳ ප්‍රකාශනයක් දැනට සකස් කෙරෙමින් පවතී. රසායන ද්‍රව්‍ය සහ වීදුරු උපකරණ සඳහා ඇණවුම් සම්පූර්ණ කරනු ලැබ ඉදිරිපත් කර ඇත. ජෛව පටල ජෛව පොහොර - අම්බලන්තොට, අම්පාර, නිකවැරටිය සහ මහියංගනය යන ප්‍රදේශවල සිදුකරනු ලැබූ පරීක්ෂා 64 කින් 42 ක් ක්‍රියාත්මකව පවතින අතර ජෛව පටල ජෛව පොහොර යෙදීම යටතේ පැළෑටි වර්ධනය සාර්ථක බව නිරීක්ෂණය වේ. ඒකරාශී කරනු ලැබූ පාංශු සහ පැළෑටි සාම්පල සහ වෙන්කරගනු ලැබූ ක්ෂුද්‍ර ජීවීන් විද්‍යාගාරයන්හි විශ්ලේෂණය කෙරෙනු ලැබේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ එක්ව සිදුකළ ජෛව පොහොර පිළිබඳ ඒකාබද්ධ යෝජනාවෙහි ප්‍රතිඵල අමාත්‍යාංශය හරහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති අතර අනුමැතිය අපේක්ෂාවෙන් පසුවේ.
93	කාර්මික තාක්ෂණ ආයතනය (ITI), ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI), ජාතික නිරෝධායන මධ්‍යස්ථානය සහ ජලජීවී පර්යේෂණ පිළිබඳ ජාතික නියෝජිතායතනය (ITI-50, SLSI-150	ITI	50	0	විද්‍යාගාර නවීකරණයන් සහ පවතින කාර්යමණ්ඩල පුහුණුව සම්පූර්ණ කරනු ලැබ ඇති කාර්යමණ්ඩලය බඳවාගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙහි අනුමැතිය අපේක්ෂාවෙන් පසුවන අතර නව උපකරණ සමහරක් දැනටමත් මිලදී ගනු ලැබ ඇත. කාර්මික තාක්ෂණ ආයතනය විසින් අදාල ලේඛන (TEC/DPC සටහන්) අමාත්‍යාංශය වෙත ඉදිරිපත්කරනු ලැබ ඇති අතර මුදල් අපේක්ෂාවෙන් පසුවේ. විද්‍යාගාරය සඳහා උපකරණ මිලදී ගනු පිණිස ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකෙරේ.
		SLSI	150	0	ERP පද්ධතිය සඳහා අවශ්‍යතා තක්සේරුව සම්පූර්ණ කරනු ලැබ ඇති අතර ටෙන්ඩර් ලේඛන සකසමින් පවතී.

101	COSTI ඒකකය NASTICA බවට පරිවර්තනය කිරීම	අමාත්‍යාංශය	25	0	අමාත්‍යාංශය විසින් සිදුකරනු ලැබූ නිරීක්ෂණයන් හා පැහැදිලි කිරීම් සඳහා විසඳුම් සපයාදීමෙන් අනතුරුව, පනතෙහි අවසන් කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. අමාත්‍යාංශය විසින් ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ සහතිකයක් නිකුත්කිරීම ඉල්ලා සිටිමින් එය නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කෙරෙනු ඇත.
103	යාන්ත්‍ර ඉලෙක්ට්‍රෝන විද්‍යාවන් සවිබල ගැන්වෙන ආර්ථික සංවර්ධන මූලාරම්භය (MEDI) හරහා නිෂ්පාදන සැලසුම් ඉංජිනේරු විද්‍යාව (PDE) සඳහා සහායය ලබාදීම	අමාත්‍යාංශය	250	0	SPTF යෝජනාව සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත. NERDC මධ්‍යස්ථානය වෙත අරමුදල් පවරාදීම සඳහා අක්මුදල් අපේක්ෂාවන් පසුවේ.
124	දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන සඳහා සැලසුම් නිර්මාණ මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම	අමාත්‍යාංශය	25	15	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙත දැව සැලසුම් නිර්මාණ නවෝත්පාදන මධ්‍යස්ථානය සඳහා අරමුදල් පවරා දී ඇති අතර මොරටුව විශ්වවිද්‍යාලය වෙත අරමුදල් පවරාදීම සඳහා අක්මුදල් අපේක්ෂාවෙන් පසුවේ.
149	පිටිපන, මාහේන්වත්ත ප්‍රදේශයේ අධිතාක්ෂණ නවෝත්පාදන උද්‍යානයක් (ශ්‍රී ලංකා ජෛවතාක්ෂණ නවෝත්පාදන උද්‍යානයක්) ස්ථාපනය කිරීම	අමාත්‍යාංශය	100	100	අධිතාක්ෂණ නවෝත්පාදන උද්‍යානය සහ ශ්‍රී ලංකා ජෛවතාක්ෂණ නවෝත්පාදන උද්‍යානය යනු එකම ව්‍යාපෘතියක් වේ. • බිම් කොටස වෙනුවෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියන 380 ක් UDA වෙත ගෙවීම සිදුකරන ලදී. • ව්‍යාපාර සැලසුමෙහි පළමු කෙටුම්පත COSTI විසින් සකස් කරනු ලැබිණි. • කළමනාකරණ ආකෘතියෙහි පළමු කෙටුම්පත COSTI විසින් සකස් කරනු ලැබිණි. • බිම් කොටස සඳහා සම්පූර්ණ මුදල ගෙවීම් කිරීම සඳහා අක්මුදල අපේක්ෂාවෙන් පසුවේ.

4. 2018 වර්ෂයේ මූල්‍යමය ජයග්‍රහණ

4.1 අමාත්‍යාංශයේ සහ ආයතනයන්හි මූල්‍යමය ජයග්‍රහණයන්හි සාරාංශය

විස්තරය	වෙන් කිරීම්		වියදම්	
	පුනරාවර්තන (රු.මි.)	ප්‍රාග්ධන (රු.මි.)	පුනරාවර්තන (රු.මි.)	ප්‍රාග්ධන (රු.මි.)
අමාත්‍ය කාර්යාලය	31.522	3.634	28.387	2.978
පරිපාලන සහ ආයතන සේවා	163.303	7.021	111.969	4.383
රාජ්‍ය අමාත්‍ය කාර්යාලය	32.250	7.345	30.494	4.113
විද්‍යා හා තාක්ෂණ සංවර්ධන වැඩසටහන්	472.71	3422.543	452.148	2163.355
ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය	23.678	108.600	23.134	20.277
ආයතන	1165.137	1259.385	1065.568	1037.696
එකතුව	**1888.600**	**4808.528**	**1711.700**	**3232.802**

4.2 අමාත්‍යාංශයේ පුනරාවර්තන වියදම්

අමාත්‍යාංශය: විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය
ශීර්ෂ අංකය : 196
කාණ්ඩය - පෞද්ගලික වේතන සහ වෙනත් පුනරාවර්තන

විස්තරය	වෙන් කිරීම් (රු.මි.)	මුළු වියදම (රු.මි.)	ශේෂය (රු.මි.)
අමාත්‍ය කාර්යාලය			
පෞද්ගලික වේතන	13.700	11.584	2.116
වෙනත් පුනරාවර්තන	17.822	16.803	1.019
එකතුව	**31.522**	**28.387**	**3.135**
පරිපාලන සහ ආයතන සේවා			
පෞද්ගලික වේතන	61.100	58.149	2.950
වෙනත් පුනරාවර්තන	102.203	53.820	48.383
එකතුව	**163.303**	**111.969**	**54.333**
රාජ්‍ය අමාත්‍ය කාර්යාලය			
පෞද්ගලික වේතන	10.700	9.529	1.171
වෙනත් පුනරාවර්තන	21.550	20.965	0.585
එකතුව	**32.250**	**30.494**	**1.756**

විද්‍යා හා තාක්ෂණ සංවර්ධන වැඩසටහන්			
එකතුව	**472.71**	**452.148**	**20.562**
ග්‍රහලෝකාගාරය			
පෞද්ගලික වේතන	10.450	10.343	0.107
වෙනත් පුනරාවර්තන	13.228	12.791	0.437
එකතුව	**23.678**	**23.134**	**0.544**
මුළු එකතුව	**723.463**	**646.132**	**77.331**

4.3 ආයතනයන්හි පුනරාවර්තන වියදම්

අමාත්‍යාංශය : විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

ශීර්ෂ අංකය : 196

කාණ්ඩය - පෞද්ගලික වේතන සහ වෙනත් පුනරාවර්තන

විස්තරය	වෙන් කිරීම් (රු.මි.)	මුළු වියදම (රු.මි.)	ශේෂය (රු.මි.)
රාජ්‍ය ආයතන			
නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය	136.637	127.700	8.937
ජාතික මූලික අධ්‍යයන ආයතනය	190.000	185.023	4.977
කාර්මික තාක්ෂණ ආයතනය	280.000	240.000	40.000
ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය	290.000	255.520	34.480
ජාතික පර්යේෂණ සභාව	23.000	22.807	0.193
ජාතික විද්‍යා පදනම	140.000	139.501	0.499
ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම	33.000	23.134	3.865
ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය	19.500	17.064	2.436
ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසම	53.000	48.819	4.181
එකතුව	**1165.137**	**1065.568**	**99.569**

4.4 අමාත්‍යාංශයේ ප්‍රාග්ධන වියදම

4.4.1 අමාත්‍යාංශය : විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

ශීර්ෂ අංකය : 196

කාණ්ඩය : පුනරුත්ථාපන සහ අත්කරගැනීම

විස්තරය	වෙන් කිරීම් (රු.මි.)	මුළු වියදම (රු.මි.)	ශේෂය (රු.මි.)
අමාත්‍ය කාර්යාලය			
පුනුරුත්ථාපන	1.400	0.751	0.648
අත්කරගැනීම්	2.234	2.227	0.007
එකතුව	**3.634**	**2.978**	**0.656**
පරිපාලන හා ආයතන සේවා			
පුනුරුත්ථාපන	5.425	2.894	2.531
අත්කරගැනීම්	0.248	0.226	0.022
ශක්‍යතා ගොඩනැංවීම	1.348	1.262	1.238
එකතුව	**7.021**	**4.383**	**2.639**
රාජ්‍ය අමාත්‍ය කාර්යාලය			
පුනුරුත්ථාපන	6.700	3.471	3.229
අත්කරගැනීම්	0.645	0.642	0.003
එකතුව	**7.345**	**4.113**	**3.232**
මුළු එකතුව	**18.000**	**11.474**	**6.527**

4.4.2 අමාත්‍යාංශය: විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

ශීර්ෂ අංක : 196

කාණ්ඩය :පුනරුත්ථාපන, අත්කරගැනීම් සහ අනෙකුත් ප්‍රාග්ධන වියදම්

විස්තරය	වෙන් කිරීම් (රු.මි.)	මුළු වියදම (රු.මි.)	ශේෂය (රු.මි.)
විද්‍යා හා තාක්ෂණ සංවර්ධන වැඩසටහන්			
1.විද්‍යාතා වැඩසටහන්			
එකතුව	**166.543**	**135.951**	**30.592**
2. පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන			
විද්‍යා හා තාක්ෂණ ප්‍රචලිත කිරීමේ වැඩසටහන	20.000	12.822	7.178
විද්‍යාත්මක පුහුණුව	20.000	8.335	11.665
වෙනත් රටවල් සමඟ විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාවයන්	30.000	29.977	0.023
පර්යේෂණ ව්‍යාපෘති සඳහා පහසුකම් සලසාදීම	5.000	0.480	4.520
විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු විද්‍යා සහ ගණිත අධ්‍යාපනය	25.000	12.224	12.776
යුරෝපීය සංවිධානයෙහි ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම	46.000	31.956	14.044
එකතුව	**146.000**	**95.794**	**50.206**

3. නිනිති තාක්ෂණය			
පිරියත හා උපකරණ	190.000	187.020	2.980
ගොඩනැගිලි සහ ව්‍යුහයන්	1000.000	966.177	33.826
කොටස් දායකත්වය	125.000	55.000	70.000
පර්යේෂණ හා සංවර්ධන	78.000	74.031	3.969
වෙනත්	50.000	49.560	0.440
එකතුව	**1443.000**	**1331.785**	**111.215**
4. පර්යේෂණ හා සංවර්ධන ආයෝජන රාමුව ක්‍රියාත්මක කිරීම			
පර්යේෂණ හා සංවර්ධන	15.000	14.592	0.408
එකතුව	**15.000**	**14.592**	**0.408**
5. විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය (COSTI)			
ආයෝජනයන්	30.000	2.956	27.043
එකතුව	**30.000**	**2.956**	**27.043**
6. ජාතික විද්‍යා මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම			
පර්යේෂණ හා සංවර්ධන	240.000	81.098	158.902
එකතුව	**240.000**	**81.098**	**158.902**
7. සූර්ය පැනල නිෂ්පාදන මූලාකෘති			
පිරියත හා උපකරණ	36.250	2.363	33.287
පර්යේෂණ හා සංවර්ධන	3.750	3.683	0.066
එකතුව	**40.000**	**6.646**	**33.354**
8. ග්‍රහලෝකාගාරය			
පුනුරුත්ථාපන	35.500	14.016	21.484
අත්කරගැනීම්	61.500	5.042	56.458
වෙනත් ප්‍රාග්ධන වියදම්	10.000	0	10.000
ධාරිතා ගොඩනැංවීම	1.000	0.890	0.110
විද්‍යාව හා සංවර්ධනය සඳහා ජාත්‍යන්තර සහයෝගීතාවය	0.600	0.329	0.271
එකතුව	**108.600**	**20.277**	**88.323**
මුළු එකතුව	**2189.143**	**1689.099**	**500.043**

4.4.3 අමාත්‍යාංශය : විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

ශීර්ෂ අංකය : 196

කාණ්ඩය : අයවැය යෝජනා

විස්තරය	* ප්‍රතිපාදන වෙන් කිරීම් (රු.මි.)	වියදම (රු.මි.)	ශේෂය (රු.මි.)
අයවැය යෝජනා			
1. රාජ්‍ය / පෞද්ගලික සහයෝගීතාවය යටතේ ජෛව තාක්ෂණ නවෝත්පාදන උද්‍යානය ස්ථාපනය	400.000	395.320	4.679
2. ජාන විද්‍යාව පිළිබඳ විශිෂ්ටත්ව මධ්‍යස්ථානයක් ස්ථාපනය	50.000	0	50.000
3. තාක්ෂණ බීජෞෂණාගාර ස්ථාපනය	75.000	5.000	70.000
4. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සඳහා විද්‍යාගාර පහසුකමක් ස්ථාපනය	44.000	0	44.000
5. සමාජ නවෝත්පාදන විද්‍යාගාරයක් ස්ථාපනය	40.000	25.000	15.000
6. කාර්මික තාක්ෂණ ආයතනයේ පෙට්‍රෝලියම් නිෂ්පාදන පරීක්ෂා පහසුකමක් ස්ථාපනය	100.000	5.000	95.000
7. යාන්ත්‍රි ඉලෙක්ට්‍රොනික විද්‍යාවෙන් සවිබල ගැන්වෙන ආර්ථික සංවර්ධන මූලාරම්භය	325.000	0	325.000
8. අභ්‍යවකාශ තාක්ෂණ ශක්‍යතා ගොඩනැංවීම	33.000	5.000	28.000
9. කාර්මික තාක්ෂණ ආයතනයේ සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ පරීක්ෂා පහසුකම් ඉහළ නැංවීම	200.00	5.109	194.891
10. දැව ආශ්‍රිත නිෂ්පාදන සඳහා සැලසුම්නිර්මාණ මධ්‍යස්ථානයක් ස්ථාපනය	25.000	15.500	9.500
11. පොහොර වැඩිදියුණු කිරීම සහ පාංශු කළමනාකරණය හරහා නිසරුභාවයට පත් වූ බිම් සරු බිම් බවට පත් කිරීම	50.000	38.602	11.397
එකතුව	**1342.000**	**494.531**	**847.467**

*මෙම ප්‍රතිපාදන යටතේ අමාත්‍යාංශ වැයශීර්ෂය යටතේ වෙන්වූ පුතිපාදන කොටස් ද ඇතුලත්ව ඇත.

4.5 ආයතනයන්හි ප්‍රාග්ධන වියදම්

4.5.1 අමාත්‍යාංශය: විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය

ශීර්ෂ අංකය : 196

කාණ්ඩය : පුනරුත්ථාපන සහ අත්කරගැනීම් සහ වෙනත් ප්‍රාග්ධන වියදම්

විස්තරය	වෙන් කිරීම් (රු.මි.)	මුළු වියදම (රු.මි.)	ශේෂය (රු.මි.)
නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය (ACCIMT)	100.000	37.002	62.998
ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS)	120.000	98.194	21.806
කාර්මික තාක්ෂණ ආයතනය (ITI)	350.000	303.740	46.260
ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERDC)	57.000	57.000	0
ජාතික පර්යේෂණ සභාව (NRC)	200.00	162.050	37.950
ජාතික විද්‍යා පදනම (NSF)	300.385	283.692	16.693
ජාතික විද්‍යා හා තාක්ෂණික කොමිසම (NASTEC)	12.000	10.269	1.731
අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය (SLAB)	0	0	0
ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම (SLIC)	120.000	85.750	34.250
මුළු එකතුව	**1259.385**	**1037.696**	**221.689**

4.6 අත්තිකාරම් ගිණුම්

රජයේ කාර්යයන් සඳහා වියදම්හි උපරිම සීමාවන් (ශ්‍රී.ලං.රු.)	රජයේ කාර්යයන් සඳහා ලැබීම්හි අවම සීමාවන් (ශ්‍රී.ලං.රු.)	රජයේ කාර්යයන්හි හර ඉතිරිය සඳහා උපරිම සීමාවන් (ශ්‍රී.ලං.රු.)
33,000,000.00	17,500,000.00	95,000,000.00

3 වන මහල, සෙත්සිරිපාය, 1 වන අදියර, බත්තරමුල්ල
3rd Floor, Sethsiripaya, 1st Stage, Battaramulla
3 ஆவது தளம், செத்சிறிபாய கட்டம் - 1, பத்தரமுல்லை